06. **"බුලතා"** නම් යෝධයා කර වූ වැව කුමක් ද?
    (1) සොරබොර වැව (2) අංගමු වැව (3) බුලන්කුලම වැව (4) දූඹුටුලු වැව

07. පැරණි ආරාම පරිපාලනය පිළිබඳ තොරතුරු ලැබී ඇති සෙල්ලිපිය කුමක් ද?
    (1) ගල්පොත පුවරු ලිපිය (2) සංගමු විහාර සෙල්ලිපිය
    (3) අඹගමු සෙල්ලිපිය (4) මිහින්තලා පුවරු ලිපිය

08. අතීතයේ රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස දැක්වෙන ජල බද්ද හැඳින්වූ නම කුමක් ද?
    (1) බොජකපති (2) මාතෙරමජිබකපති (3) දකපති (4) හතිපති


www.pirivena.lk

09. පළමුවන සේන රජ දවස අනුරාධපුර රාජධානිය ආක්‍රමණය කළ දකුණු ඉන්දීය ආක්‍රමණිකයා කවුද?

(1) I වන රාජ රාජ (2) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ (3) කරිකාල (4) I වන පරන්තක

10. මහා විජයබාහු රජුගේ ළමා කාලය පිළිබඳ තොරතුරු දැක්වෙන අභිලේඛනය කුමක් ද?

(1) වල්ලිපුරම් රන්පත (2) පනාකඩුව තඹ සන්නස

(3) වේලෙක්කාර සන්නස (4) අල්ලෙ සන්නස

11. මහා පරාක්‍රමබාහු කුමරු උපන් ස්ථානයේ ඉදි කර තිබූ ස්තූපය කුමක් ද?

(1) සේල චෛතිය (2) සූතිඝර චෛතිය (3) සඳගිරි වෙහෙර (4) ගිරිහඬු සෑය

12. පොලොන්නරුවේ සිහසුනට තෙවරක් ම පත් වූ රාජකීය කාන්තාව කවුද?

(1) ලීලාවතී රැජින (2) සුගලා දේවිය (3) කල්‍යාණවතී රැජින (4) අනුලා දේවිය

13. මහාවංශයේ සඳහන් වන ආකාරයට මහා පරාක්‍රමබාහු රජ දවස ඉදි කර තිබූ මහ වැව් සංඛ්‍යාව කීයද?

(1) 152 (2) 163 (3) 176 (4) 341

14. මහා පරාක්‍රමබාහු රජ දවස දකුණු ඉන්දියාවෙන් රැගෙන ආ සිරකරුවන් යොදවා සැකසූ බව කියවෙන පැරණි ම ස්තූපය කුමක් ද?

(1) කිරි වෙහෙර (2) රන්කොත් වෙහෙර (3) පබළු වෙහෙර (4) දෙමළ මහා සෑය

15. පොලොන්නරු යුගයට අයත් වටිනා පැරණි චිත්‍ර රැසක් හඳුනා ගත හැකි විහාරය කුමක් ද?

(1) තිවංක පිළිමගෙය (2) ථූපාරාම පිළිමගෙය

(3) ලංකාතිලක පිළිමගෙය (4) විද්‍යාධාර ගුහාව

➢ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් ඒක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නො ගැළපේ. ඒම නො ගැළපෙන නාමය තෝරන්න.**

16. (1) මහානාග (2) ගෝඨාභය (3) යටාලතිස්ස (4) දේවානම්පියතිස්ස

17. (1) කළු ගඟ (2) ජය ගඟ (3) කැළණි ගඟ (4) මැණික් ගඟ

18. (1) ඵුස්සදේව (2) නන්දිමිත්‍ර (3) දීඝජන්තු (4) ගෝඨයිම්බර

19. (1) ශෙනපති (2) මහමත (3) ගණක (4) හතිපති

20. (1) ජානකීහරණය (2) අමාවතුර (3) සසදාවත (4) මුවදෙව්දාවත

➢ **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් ඒක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නො ගැළපේ. එම නො ගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. (1) වළගම්බා - කපිසීස ඇමති (2) ධාතුසේන - මිගාර ඇමති

(3) මහසෙන් - මේඝවර්ණාභය ඇමති (4) මහා පරාක්‍රමබාහු - රවිදේව ඇමති

22. (1) උත්තර පස්ස - උතුරු පස (2) දක්ඛිණ පස්ස - දකුණු පස

(3) ප්‍රාචීන පස්ස - වයඹ පස (4) පශ්චිම පස්ස - බටහිර පස

23. (1) පණ්ඩුකාභය කුමරු - ස්වර්ණපාලි කුමරිය (2) කිත්ති කුමරු - ලෝකිතා දේවිය
(3) දුටුගැමුණු කුමරු - විහාර මහා දේවිය (4) I පරාක්‍රමබාහු කුමරු - රත්නාවලි බිසව

24. (1) කුම්භකාරගාම - කුඹල්කරුවන් විසූ ගම (2) මණිකාරගාම - මැණික්කරුවන් විසූ ගම
(3) වඩ්ඪකීගාම - වඩුවන් විසූ ගම (4) පේසකාරගාම - පෙදරේරුවන් විසූ ගම්

25. (1) ලෝහ ප්‍රාසාදය - දුටුගැමුණු රජු
(2) රත්න ප්‍රාසාදය - මානවම්ම රජු
(3) වෛජයන්ත ප්‍රාසාදය - I පරාක්‍රමබාහු රජු
(4) සත්මහල් ප්‍රාසාදය - නිශ්ශංකමල්ල රජු

➢ **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A) , (B) , (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

(A) සහ (B) පමණක් නිවැරදි නම් අංක 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් අංක 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් අංක 3 ද,
(A) සහ (D) පමණක් නිවැරදි නම් අංක 4 ද, සලකුණු කරන්න.

26. දෙවනපෑතිස් රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි ද?
A. ක්‍රි.පූ. 250 සිට 210 දක්වා රාජ්‍ය පාලනය සිදු කිරීම.
B. ජේතවන දාගැබ ඉදි කිරීම.
C. මහ විලච්චිය වැව ඉදි කිරීම.
D. සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම.

27. පොලොන්නරු යුගයේ ජීවත් වූවෙකුට පහත කවර සිද්ධීන් අසන්නට ඉඩකඩ තිබේ ද?
A. පළමුවන ගජබාහු රජු පත්තිනි සලඹ රැගෙන ඒම.
B. චන්ද්‍රභානුගේ ආක්‍රමණය සිදු වීම.
C. ජාතක පොත සිංහලට පරිවර්තනය කිරීම.
D. දෙවන අග්බෝ රජු ගිරිතලේ හා කන්තලේ වැව් ඉදි කිරීම.

28. පළමු පරාක්‍රමබාහු රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
A. කුඩා අවදියේ කිත්සිරි මේඝ රජු යටතේ ඇති දැඩි වීම.
B. දෙවන ගජබාහු රජු සමග ගිවිසුමකට එළඹීම.
C. තිලෝකසුන්දරී කුමරිය විවාහ කර ගැනීම.
D. පොලොන්නරුවේ රන්කොත් වෙහෙර ඉදි කිරීම.

29. අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳ වැටීම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි ද?
A. කාලිංග මාඝ ආක්‍රමණය
B. දුර්වල පාලකයන් බලයට පත් වීම.
C. වාරිමාර්ග පද්ධතිය බිඳ වැටීම.
D. කාලිංග - පාණ්ඩ්‍ය බල අරගලය

30. පොලොන්නරු යුගයේ කලාව හා ගෘහ නිර්මාණ සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
A. නිර්මාණ සඳහා කලුගල් හා හුණුගල් භාවිතය
B. සඳකඩ පහණේ නිරූපිත සතුන් අතර ගවයා ප්‍රමුඛ වීම.
C. දකුණු ඉන්දියානු චෝල කලා සම්ප්‍රදායේ ලක්ෂණ ඉස්මතු වීම.
D. ගල් විහාරය මූර්ති කලාවේ විශිෂ්ට නිර්මාණයක් ලෙස පෙන්නුම් කිරීම.


www.pirivena.lk

➢ **අංක 31 සිට 36 තෙක් දක්වා ඇති නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම / ප්‍රකාශන සමග කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. වසභ රජු | A. කලා වැව |
| 2. ධාතුසේන රජු | B. තෝපා වැව |
| 3. පළමු වන උපතිස්ස රජු | C. නාච්චදූව වැව |
| 4. දෙවන මොග්ගල්ලාන රජු | D. හිරිවඩුන්න වැව |

(1) A B C D (2) B A D C (3) C B D A (4) D A B C

32.

| X | Y |
|---|---|
| 1. වළගම්බා රජු | A. කල්‍යාණවතී බිසව |
| 2. පළමුවන විජයබාහු රජු | B. ලීලාවතී බිසව |
| 3. පළමුවන පරාක්‍රමබාහු රජු | C. සෝමා දේවිය |
| 4. නිශ්ශංකමල්ල රජු | D. තිලෝකසුන්දරී කුමරිය |

(1) A C D B (2) B A D C (3) C D B A (4) D C B A

33.

| X | Y |
|---|---|
| 1. තොලුවිල පිළිමය | A. හිඳි පිළිමය |
| 2. අවුකන පිළිමය | B. හිටි පිළිමය |
| 3. ගල් විහාර පිළිමය | C. බෝසත් පිළිමය |
| 4. බුදුරුවගල | D. සැතපෙන පිළිමය |

(1) A C D B (2) B A D C (3) C D B A (4) D C B A

34.

| X | Y |
|---|---|
| 1. තෝනිගල සෙල්ලිපිය | A. ගව ඝාතනයට මරණ දඬුවම |
| 2. වේවැල්කැටිය සෙල්ලිපිය | B. බැංකුවක ධාන්‍ය තැන්පත් කිරීම. |
| 3. දෙවනගල සෙල්ලිපිය | C. බුරුම ආක්‍රමණය |
| 4. අඹගමු සෙල්ලිපිය | D. ශ්‍රී පාදස්ථානයට කරන ලද පූජා |

(1) A C D B (2) B A D C (3) C D B A (4) D C B A

35.

| X | Y |
|---|---|
| 1. ෂඩ් ද්‍රවිඩ ආක්‍රමණය | A. දෙවන සේන රජ දවස |
| 2. තුන්වන ක්‍රිෂ්ණ | B. පරාක්‍රම පාණ්ඩ්‍ය රජ දවස |
| 3. පළමුවන රාජේන්ද්‍ර ආක්‍රමණය | C. මිත්තසේන රජ දවස |
| 4. කාළිංස මාඝ ආක්‍රමණ | D. පස්වන මිහිඳු රජ සවස |

(1) A B C D (2) B A D C (3) C A D B (4) D C B A

➢ **අංක 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 යන කවර ප්‍රකාශ යුගලය දැ යි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | කාවන්තිස්ස රජු සේරුවිල මංගල මහා සෑය කරවීම. | දුටුගැමුණු රජතුමා මිරිසවැටිය ස්තූපය ඉදි කිරීම. |
| 37. | වැවක පිටවාන මගින් ඇළට ජලය මුදා හැරීම. | සළපනාව මගින් සිදු කෙරෙනුයේ වැව් බැම්ම සේදී යාම වැළැක්වීම යි. |
| 38. | කල්‍යාණවතී පොලොන්නරුවේ සිහසුනට දෙවරක් ම පත් වූ කාන්තාව ය. | නිශ්ශංකමල්ල රජුගෙන් පසු පොලොන්නරු සිහසුනට පත් වූයේ සුගලා දේවිය යි. |
| 39. | වල්ලිපුරම් රන් සන්නස අනුව වසභ රජුගේ ඉසිගිරි ඇමතියා නකදිව පාලනය කරයි. | පනාකඩුව තඹ සන්නසට අනුව පළමුවන විජයබාහු රජු බුදල්නාට ප්‍රධාන අමාත්‍ය ධූරය ලබා දී ඇත. |
| 40. | පොලොන්නරුවේ තිවංක පිළිම ගෙය පැරණි චිත්‍ර නිරූපිත වටිනා ස්මාරකයකි. | මැදිරිගිරිය හා ආළාහන පිරිවෙන් සංකීර්ණය පැරණි ලංකාවේ වෛද්‍ය තාක්ෂණය පෙන්නුම් කරන වටිනා නටඹුන් සහිත ස්ථාන දෙකකි. |


www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I I |
|---|---|---|

පැය දෙකයි.

# පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2024
## 5 ශ්‍රේණිය

## (07) ඉතිහාසය - II පත්‍රය

සැ.යු.

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.**

01. I. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර, නම් කරන්න.

1. මහාතිත්ථ (මාතොට) 2. අනුරාධපුරය 3. මැණික් ගඟ
4. මහියංගනය 5. දීඝගාම 6. පරාක්‍රම සමුද්‍රය

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 × 6 = 06)

➢ **පහත දී ඇති හා රූපසටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

II. (අ) A වලින් දැක්වෙන රූපය කුමක් ද?

(ආ) මෙම නිර්මාණය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?

(ඉ) මෙම නිර්මාණය ඉදි කරවන ලද රජතුමා කවරෙක් ද?

(ලකුණු 03)



A රූපය

III. (අ) B වලින් දැක්වෙන රූපය කුමක් ද?

(ආ) මෙම රූපය හමු වී ඇති ස්ථානයේ පිහිටි ස්තූපය හැඳින්වෙන නම කුමක් ද?

(ඉ) මෙය හමු වූ ස්ථානයේ උපන් බව සැලකෙන රාජ කුමාරයා කවුරුන් ද?

(ලකුණු 03)



B රූපය

02. I. අනුරාධපුර යුගයේ රචිත පාලි වංසකතා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. පහත සඳහන් ඓතිහාසික සිද්ධීන්වලට සම්බන්ධ අනුරාධපුර පාලකයන් වරහන් තුළින් තෝරා ලියන්න.

(a) පළමුවරට තුන් සිංහලය එක්සේසත් කිරීම.

(b) දන්ත ධාතූන් වහන්සේ වැඩම කළ සමයේ පාලනය ගෙන යාම.

(c) රිටිගල ආරාම සංකීර්ණය ඉදි කිරීම.

(d) කලා වැව ඉදි කිරීම.

(දේවානම්පියතිස්ස , දුටුගැමුණු , මහසෙන් , වළගම්බා , කිර්ති ශ්‍රී මේඝ , ධාතුසේන , පළමුවන සේන , දෙවන සේන)

(ලකුණු 04)

III. අතීතයේ මෙරට වැසියා රජතුමාගෙන් අපේක්ෂා කළ යුතුකම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. I. අනුරාධපුර යුගයේ මහ වැව් ඉදි කළ පාලකයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II. මහ වැව් ඉදි කිරීමේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

III. අනුරාධපුර යුගයේ වෙළෙඳ කටයුතු ඉතා දියුණු මට්ටමක පැවති බව නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. I. ඉන්දියාවේ සිට ලංකාවට වරින් වර සංක්‍රමණය වූ ජන කණ්ඩායම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. අනුරාධපුර යුගයේ පාලකයන් ඉන්දියාව සමග පැවැත් වූ සම්බන්ධතා වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 04)

III. අනුරාධපුර යුගයේ මෙරට වැසියා සතු ව ඉතා දියුණු තාක්ෂණික දැනුමක් පැවතුණු බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. I. මහා විජයබාහු රජතුමාගේ දෙමව්පියන් නම් කරන්න. (ලකුණු 02)

II. බලය තහවුරු කර ගැනීමේ දී මහා විජයබාහු රජතුමා මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න. (ලකුණු 04)

III. මහා විජයබාහු රජතුමා මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. I. මහා පරාක්‍රමබාහු රජතුමා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි සෙල්ලිපි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මහා පරාක්‍රමබාහු රජතුමාට ලංකාව එක්සේසත් කිරීමේ දී සටන් කිරීමට සිදු වූ ඔහුගේ ඥාතීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

III. මහා පරාක්‍රමබාහු රජතුමාගේ ආගමික සේවය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. I. (a) පොලොන්නරුවේ ආරම්භක පාලකයා නම් කරන්න. (ලකුණු 01)

(b) පොලොන්නරුවේ බලයට පත් වූ අවසාන පාලකයා කවරෙක් ද? (ලකුණු 01)

II. පොලොන්නරු රාජධානිය පරිහානියට හා බිඳ වැටීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

III. **"පොලොන්නරු යුගයේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය විශේෂතා රැසක් පෙන්නුම් කරයි."** නිදසුන් තුනක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. පහත දැක්වෙන මාතෘකා **<u>දෙකක්</u>** පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

I. මහසෙන් රජතුමා

II. අනුරාධපුර රාජධානියට එල්ල වූ චෝළ ආක්‍රමණ

III. නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග

IV. ගල් විහාරය

(ලකුණු $6 \times 2 = 12$)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜரிமையுஜடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I I |
|---|---|---|

පැය දෙකයි.

# පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2024
## 5 ශ්‍රේණිය

## (07) ඉතිහාසය - II පත්‍රය

සැලකිය යුතුයි :

- දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 1 (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමග අමුණා බාර දෙන්න.



# ඉතිහාසය

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 5 ශ්‍රේණිය



# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018

## Primary Piriven Year End Term Test - 2018

**05 ශ්‍රේණිය/Grade 05**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ඉතිහාසය** I, II — **කාලය : පැය තුන යි**

**History** I, II — **Time : Three Hours**

**ඉතිහාසය I**

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමිවේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. අතීතයෙන් පාඩම් ඉගෙනීමෙන් වර්තමාන ගැටලුවලට විසඳුම් ලබාගත හැකි බව ප්‍රකාශ කළේ,

i. ජී.එම්. ට්‍රෙව්ලියන් ය. ii. ඊ.එච්. කාර් ය.
iii. ඩියඩෝරස් iv. ශ්‍රී ජවහර්ලාල් නේරු ය.

02. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ගැන තොරතුරු සොයන්නෙකුට වැදගත් වන මූලාශ්‍රය මින් කුමක්ද?

i. අභිලේඛන ii. ගුහා චිත්‍ර
iii. ජන කතා iv. ගල් මෙවලම්

03. ක්‍රි. ව. 811 සියවස් තුළ දී රචනා වූ යැයි සැලකෙන, එමෙන්ම මහාවංස ටීකාව ලෙස ද හඳුන්වන කෘතිය නම් කරන්න.

i. දීපවංසය ii. සමන්ත පාසාදිකාව
iii. වංසත්ථප්පකාසිනිය iv. බෝධිවංසය

04. මහින්දාගමනයේ ඓතිහාසිකත්වය සනාථ කිරීමට වැදගත් වන වටිනාම සෙල්ලිපිය හමු වී තිබෙනුයේ,

i. දිඹුලාගල ප්‍රදේශයෙනි ii. යාපනය ප්‍රදේශයෙනි
iii. මැදිරිගිරිය ප්‍රදේශයෙනි iv. අම්පාර රජගල ප්‍රදේශයෙනි

05. අපේ පුරා වස්තු රැක ගැනීම වඩාත් වැදගත් වන්නේ,

i. අතීතයට අයත් දේවල් නිසා ය. ii. දේශීය උරුමය ප්‍රදර්ශනය කිරීමට හේතුවන නිසා ය.
iii. මිල කළ නොහැකි දේවල් නිසා ය. iv. සංචාරකයන්ට පෙන්විය හැකි නිසා ය.

06. ක්‍රි. ව. 17 වන සියවසේ උඩරට රාජධානිය සම්බන්ධයෙන් වටිනා තොරතුරු ඇතුළත් කෘතියක් වන ''එදා හෙළදිව'' රචනා කළ විදේශීය ලේඛකයා වන්නේ,

i. මෙගස්තිනිස් ය. ii. ඉබන් බතුතා ය.
iii. රොබට් නොක්ස් ය. iv. පාහියන් හිමි ය.

07. මළ සිරුරු දිරා යන තුරු වළලා පසුව ගොඩගෙන හිස් කබල සුමට කිරීම, එහි ගුරු ගල් ආලේප කිරීම යන චාරිත්‍ර විධි පිළිබඳ සාධක ලැබෙන්නේ මින් කවර කාල පරිච්ඡේදයක දී ද?

i. ප්‍රාග් ඓතිහාසික යුගය
ii. පූර්ව ඓතිහාසික යුගය
iii. මුල් ඓතිහාසික යුගය
iv. ඓතිහාසික යුගය

08. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීමේ වැදගත්කම සම්බන්ධයෙන් අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

i. ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම.
ii. ලංකාව හා දකුණු ඉන්දියාව පටු මුහුද තීරයකින් වෙන්ව පිහිටීම.
iii. ලංකාව ආසියා මහද්වීපයේ පිහිටි කුඩා ම දූපත වීම.
iv. ලංකාව දකුණු ආසියාවේ ඇති විශාල ම දූපත වීම.

09. ශ්‍රී ලංකාවට බහුල වශයෙන් දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් පැමිණීම සඳහා භාවිත කළ වයඹ දිග වෙරළ තීරයේ පිහිටා ඇති ස්වාභාවික වරාය වනුයේ,

i. මහාතිත්ථ වරාය යි.
ii. දඹකොළ පටුන වරාය යි.
iii. ගෝකණ්ණ වරාය යි.
iv. හම්බන්තොට වරාය යි.

10. අනුරාධපුර රාජධානියේ බිඳ වැටීමට බලපෑ ආසන්න ම හේතුව,

i. දුර්වල පාලකයන් බලයට පත්වීම.
ii. I රාජ රාජ හා I රාජේන්ද්‍ර ආක්‍රමණය.
iii. කාලිංග මාඝ ආක්‍රමණය.
iv. වාරිමාර්ග පද්ධතිය බිඳ වැටීම.

11. මහින්දාගමනයෙන් පසුව මෙරට ඉදිකළ ප්‍රථම ඓතිහාසික ස්තූපය කුමක්ද?

i. රුවන්වැලි සෑය
ii. මිරිසවැටිය
iii. ථූපාරාමය
iv. ලංකාරාමය

12. යාපහුව රාජධානිය ප්‍රථම වරට අගනුවර වශයෙන් තෝරාගත් පාලකයා වන්නේ,

i. පළමු බුවනෙකබාහු රජතුමා ය.
ii. දෙවන බුවනෙකබාහු රජතුමා ය.
iii. බෝසත් විජයබාහු රජතුමා ය.
iv. තුන්වන විජයබාහු රජතුමා ය.

13. පෘතුගීසි ජාතිකයන් අහඹු ලෙස ගොඩබට ලංකාවේ දකුණේ පිහිටි වරාය කුමක් ද?

i. ගොඩවාය වරාය
ii. දෙවිනුවර වරාය
iii. ගාලු වරාය
iv. කොළඹ වරාය

14. ක්‍රි. ව. 1602 දී ලන්දේසි ලංකාවට ගොඩබසින විට උඩරට පාලකයා වශයෙන් කටයුතු කරනු ලැබුයේ,

i. පළමු විමලධර්මසූරිය රජතුමා ය.
ii. දෙවන විමලධර්මසූරිය රජතුමා ය.
iii. දෙවන රාජසිංහ රජතුමා ය.
iv. සෙනරත් රජතුමා ය.

15. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය ගෙන ගිය පළමු ආණ්ඩුකාරවරයා වූයේ,

i. සර් ප්‍රෙඩ්රික් නෝත් ය.
ii. රොබට් බ්‍රවුන්රිග් ය.
iii. තෝමස් මේට්ලන්ඩ් ය.
iv. එඩ්වඩ් බාන්ස් ය.

www.pirivena.lk

**අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නම තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

16. i. ඇතැන්ස් ii. ස්පාටා iii. ඔඩිසි iv. ඇකේඩියා

17. i. මගධ ii. කෝසල iii. අවන්ති iv. අජන්තා

18. i. බුරුමය ii. ඉන්දියාව iii. තායිලන්තය iv. කාම්බෝජය

19. i. දඹදෙණිය ii. යාපහුව iii. ගම්පොළ iv. සීතාවක

20. i. වීර කැප්පෙට්ටිපොළ ii. ගොංගාලේගොඩබණ්ඩා
iii. වීරපුරන් අප්පු iv. හඟුරන්කෙත ඩිංගිරාළ

**අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල යුගලපද හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

21. i. දුටුගැමුණු රජු - එළාර ii. වලගම්බා රජු - සත්ද්‍රවිඩ
iii. ධාතුසේන රජු - ෂට් ද්‍රවිඩ iv. මහා විජයබාහු රජු - කාලිංග මාඝ

22. i. ජුපිටර් - අහසට අධිපති දෙවියා ii. වීනස් - මුහුදට අධිපති දෙවියා
iii. මාර්ස් - යුද්ධයට අධිපති දෙවියා iv. මිනාර්වා - අත්කම්වලට අධිපති දෙවඟන

23. i.දන්තුරේ සටන - ක්‍රි. ව. 1594 ii. බලන සටන - ක්‍රි. ව. 1602
iii. රන්දෙණිවල සටන - ක්‍රි. ව. 1630 iv. ගන්නෝරු සටන - ක්‍රි. ව. 1653

24. i. සිරිපැරකුම්බා පිරිවෙණ - මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
ii. පරම ධම්ම චේතිය පිරිවෙණ - වලානේ සිද්ධාර්ථ හිමි
iii. විද්‍යෝදය පිරිවෙණ - හික්කඩුවේ සුමංගල හිමි
iv. විද්‍යාලංකාර පිරිවෙණ - රත්මලානේ ධම්මාලෝක හිමි

25. i. ස්වේදගොන් විහාරය - බුරුමය ii. අංකෝර්වට් විහාරය - කාම්බෝජය
iii. බෝරෝ බුදූර් විහාරය - ජාවා iv. ආනන්ද විහාරය - ජපානය

**අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවල දක්වා ඇති A, B, C හා D යන ප්‍රකාශ අතරින් දෙකක් නිවැරදි ය. එම පිළිතුරුවලින් නිවැරදි ප්‍රකාශ දෙක තෝරා,**

A සහ B නිවැරදි නම් - 1 ද, B සහ C නිවැරදි නම් - 2 ද,
C සහ D නිවැරදි නම් - 3 ද, A සහ D නිවැරදි නම් - 4 ද,

පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

www.pirivena.lk

26. වසභ රජතුමා

A - ලම්බකරණ රාජවංශයේ පළමු පාලකයා වීම.

B - වසර 34ක් අනුරාධපුර රාජධානිය පාලනය කිරීම.

C - ජේතවනාරාම ස්තූපය ඉදිකිරීම.

D - වැව් 11ක් හා ඇළ මාර්ග 12ක් ඉදිකිරීම.

i. A සහ B ii. B සහ C iii. C සහ D iv. A සහ D

27. නිශ්ශංක මල්ල රජතුමා

A - පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම.

B - නිශ්ශංක ලතා මණ්ඩපය හා හැටදාගෙය තැන වීම.

C - බුරුම දේශය ආක්‍රමණය කිරීම.

D - මහා විජයබාහු රජතුමාගේ පුත්‍රයා ලෙස බලයට පත්වීම.

i. A සහ B ii. B සහ C iii. C සහ D iv. A සහ D

28. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි පාලනය

A - ක්‍රි. ව. 1796 ගිවිසුමෙන් ඔවුන්ට මුහුදුබඩ ප්‍රදේශ අයත් විය.

B - පළමු පෘතුගීසි ආණ්ඩුකාරවරයා වූයේ ලෝරන්ස් පීල් ය.

C - ක්‍රි. ව. 1580 දී තෑගි ඔප්පුවකින් ධර්මපාල රජු කෝට්ටේ රාජධානිය පෘතුගීසීන්ට පවරනු ලැබීම.

D - පෘතුගීසි ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල කතෝලික ආගම ප්‍රචාරය කරනු ලැබීය.

i. A සහ B ii. B සහ C iii. C සහ D iv. A සහ D

29. චන්ද්‍රගුප්ත මෞර්ය රජතුමා

A - කෞටිල්‍ය හෙවත් චාණක්‍ය මොහුගේ පුරෝහිතයා විය.

B - අමිත්‍රඝාත හෙවත් සතුරු රජවරු නසන්නා ලෙස ඔහු හඳුන්වා ඇත.

C - අශෝක රජතුමා මොහුගේ පුත්‍රයා විය.

D - ස්වකීය අධිරාජ්‍යය දකුණු ඉන්දියාවේ මයිසූරය දක්වා ව්‍යාප්ත කළේ ය.

i. A සහ B ii. B සහ C iii. C සහ D iv. A සහ D

30. ක්‍රි. ව. 1817-18 නිදහස් සටන,

A - වීර පුරන් අප්පු සටන මෙහෙයවන ලදී.

B - ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙන් ආරම්භ වීම.

C - රාජ ප්‍රතිරූපකයා ලෙස දොරෝසාමි ඉදිරිපත් වීම.

D - එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරයා විසින් සටන දැඩි ලෙස මර්දනය කිරීම.

i. A සහ B ii. B සහ C iii. C සහ D iv. A සහ D

**අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. එම ප්‍රකාශන කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. ඒවා ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට නිවැරදි වරණය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

31.

| X | Y |
|---|---|
| 01. බඩගරික | A දොරටු පාලකයා |
| 02. සෙනපති | B ප්‍රධාන පුරෝහිත |
| 03. මහා මත | C භාණ්ඩාගාරික |
| 04. දෝවාරික | D සේනාපති |

i. A,C,D,B　　ii. B,A,C,D　　iii. C,D,B,A　　iv. D,C,B,A

32.

| X | Y |
|---|---|
| 01. නන්දි මිත්‍ර | A පළමු විජයබාහු රජු |
| 02. කපිසීස | B වළගම්බා රජු |
| 03. රවිදේව | C පළමු පරාක්‍රමබාහු රජු |
| 04. ලංකාපුර | D දුටුගැමුණු රජු |

i. A,D,B,C　　ii. B,C,A,D　　iii. C,A,B,D　　iv. D,B,A,C

33.

| X | Y |
|---|---|
| 01. වළවේ ගඟ | A වන නදී |
| 02. මල්වතු ඔය | B ගාල්හ නදී |
| 03. දැදුරු ඔය | C කදම්භ නදී |
| 04. ගල් ඔය | D ජජ්ජර නදී |

i. A,C,D,B　　ii. B,A,C,D　　iii. C,D,A,B　　iv. D,C,B,CA

34.

| X | Y |
|---|---|
| 01. ධර්මපාල | A සපුමල් කුමරු |
| 02. හත්වන බුවනෙක බාහු | B දොන් ජුවන් පෙරිය බණ්ඩාර |
| 03. පළමු රාජසිංහ | C කොනප්පු බණ්ඩාර |
| 04. පළමු විමලධර්මසූරිය | D ටිකිරි බණ්ඩාර |

i.A,D,B,C　　ii. B,A,D,C　　iii. C,A,B,D　　iv. D C A B

35.

| X | Y |
|---|---|
| 01. ඇරිස්ටෝෆනීස් | A සුඛාන්ත කෘති |
| 02. ඊස්කිලස් | B ශෝකාන්ත කෘති |
| 03. ඇරිස්ටෝටල් | C ඓතිහාසික කෘති |
| 04. හෙරඩෝටස් | D විචාරාත්මක කෘති |

i. A,B,D,C　　ii. B,A,D,C　　iii. C,A,B,D　　iv. D,A,B,C

අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3 සහ 4 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ගෙන අදාළ නිවැරදි පිළිතුර සහිත අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | නිවැරදිය |
| 2 | නිවැරදිය | වැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36 | මහසෙන් රජතුමා සංඝමිත්‍ර භික්ෂුවගේ උපදෙස් මත මහා විහාරය විනාශ කළේ ය. | මහා පරාක්‍රම බාහු රජතුමා තිවංක පිළිම ගෙය ඉදිරිකරනු ලැබීය. |
| 37 | ලීලාවතී හා කල්‍යාණවතී යන රැජිණියන් දෙදෙනා අනුරාධපුර රාජධානියේ පාලනය ගෙන ගියේ ය. | චන්ද්‍රබානු නැමැති ආක්‍රමණිකයා පොලොන්නරු රාජධානිය ආක්‍රමණය කොට විනාශ කළේ ය. |
| 38 | ලන්දේසීන් රෝම ලන්දේසි නීතිය ලංකාවට හඳුන්වා දෙනු ලැබීය. | ඉංග්‍රීසි කෲව් මැකලම් ආණ්ඩුක්‍රමය යටතේ නව නීති පද්ධතියක් හඳුන්වා දෙනු ලැබීය. |
| 39 | පංච මහා වාද අතර පානදුරාවාදය ප්‍රමුඛ වේ. | ඕල්කට්තුමා මෙරට බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට මහත් දායකත්වයක් සැපයීය. |
| 40 | ද්වාරවතී ශිෂ්ටාචාරය පැරණි කාම්බෝජයේ පැවති ඉතා දියුණු ශිෂ්ටාචාරයකි. | පැරණි ප්‍රාචීන් පුරි නගරය තායිලන්තයේ පිහිටි පැරණි බෞද්ධ නගරයකි. |

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018

## Primary Piriven Year End Term Test - 2018

**05 ශ්‍රේණිය / Grade 05**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ඉතිහාසය** I, II
**History** I, II

**ඉතිහාසය** II

**සැලකිය යුතුයි :**

i. මෙම ප්‍රශ්න පත්‍රය I,II වශයෙන් කොටස් 2කින් සමන්විතය.
ii. I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (A) (B) (C) සහ (D) කොටස් හතරට ම පිළිතුරු සැපයිය යුතු ය.
iii. II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
iv. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

I කොටස

01)

I. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කරන්න.

01. මහා තිත්ථ　　02. නල්ලූර්　　03. දීඝගාම　　04. වළවේ ගඟ

05. මාතලේ අළු විහාරය　　06. හුරුළු වැව

(ලකුණු 06)

**A** හා **B** යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයන කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B

II. (අ) A වලින් දක්වා ඇති රූපය කුමක් ද?

(ආ) මෙය දක්නට ලැබෙනුයේ කුමන ඓතිහාසික නගරයක ද?

(ඉ) මෙය කුමන රජ සමයේ දී ඉදිකරන ලද්දක් ද? (ලකුණු 03)

III. (අ) B වලින් දැක්වෙන්නේ කුමන කලා නිර්මාණයක් ද?

(ආ) මෙම රූපය පිහිටි ස්ථානය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(ඉ) මෙම රූපය සඳහා ආභාසය ලබා ඇති ඉන්දීය කලා සම්ප්‍රදාය කුමක් ද? (ලකුණු 03)

## II කොටස

02)

i. අනුරාධපුර යුගයේ දී රචනා කරන ලද පාලි වංස කතා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. පාලි වංස කතාවල සඳහන් පරිදි වළගම්බා රාජ්‍ය සමයේ සිදු වූ වැදගත් දේශපාලන සිදුවීම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. අනුරාධපුර යුගයේ අවසානය තෙක් ආගමික ඉතිහාසය හැදෑරීමේදී සෙල්ලිපිවලට හිමි වන වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03)

i. ධාතුසේන රාජ්‍ය සමයේ ඉදි කළ ප්‍රධාන වැව් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. පැරණි ඇළ මාර්ග හා බැඳුණු තාක්ෂණයේ අංග ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පැරණි ලාංකිකයන් වැව හා බැඳි තාක්ෂණයේ උසස් නිපුණත්වයක් ලබා තිබූ බව කරුණු 02ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04) **''මහා විජයබාහු රජතුමා පොළොන්නරු රාජධානිය පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයෙකි''**

i. මහා විජයබාහු රජතුමාගේ මව්පිය දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

ii. මහා විජයබාහු රජතුමා මුහුණදුන් ප්‍රධාන අභියෝග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. මහා විජයබාහු රජතුමාගේ දේශපාලන හා ආගමික සේවා කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05) **ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල පැවති පෘතුගීසි හා ලන්දේසි පාලනයේ බලපෑම පහත මාතෘකා දෙක ඇසුරින් පැහැදිලි කරන්න.**

i. පෘතුගීසීන්ගේ පාලනය (ලකුණු 06)

ii. ලන්දේසීන්ගේ ආර්ථික බලපෑම (ලකුණු 06)

06)

i. පැරණි ග්‍රීසියේ පැවති ආගමික විශ්වාස හා ඇදහිලි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ක්‍රි. පූ. 6 වන සියවසේ ඉන්දියාවේ පැවති දේශපාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පැරණි සියමය සමඟ පැවති ලාංකීය සබඳතා කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07)

i. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ පහත සඳහන් වර්ෂවල හඳුන්වා දෙනු ලැබූ ආණ්ඩුක්‍රම නම් කරන්න.

A. 1833 B. 1931 (ලකුණු 02)

ii. බ්‍රිතාන්‍ය පාලන සමයේ දේශීය වශයෙන් ආගමික හා සංස්කෘතික පුනරුදයක් ඇතිවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ක්‍රි. ව. 1817-18 නිදහස් අරගලයට බලපෑ හේතු කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08) **පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳව ඓතිහාසික තොරතුරු විස්තර කරන්න.**

i. අනුරාධපුර සමයේ දකුණු ඉන්දීය ආක්‍රමණ

ii. දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජතුමා

iii. කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනය

iv. මහා ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයා

v. සීතාවක ප්‍රාදේශීය රාජධානිය

vi. උඩරට නායක්කර් පෙළපත (එක් කොටසකට ලකුණු 06 බැගිනි.)


උ
පළාත් මායිම්
Provincial Boundary

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven Year End Tearm Test - 2018

**05 ශ්‍රේණිය/Grade 05**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I, II
History I, II

කාලය : පැය තුන යි
Time : Three Hours

ඉතිහාසය I

සැලකිය යුතුයි :

i. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40 ක් හිමිවේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස. දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- අංක 01 සිට 15 දක්වා එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න. (ලකුණු 1 × 40 × 40)

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව විස්තර කර ඇති වංස කථාව කුමක්ද?

i. බෝධිවංසය ii. ධාතුවංසය iii. මහාවංසය iv. දීපවංසය

02. ත්‍රිපිටකයේ විනය පිටකයට බුද්ධඝෝෂ හිමියන් රචනා කරන ලද අට්ඨකථාව කුමක්ද?

i. සීහලට්ඨ කථාව ii. සමන්තපාසාදිකාව iii. බෝධි වංසට්ඨ කථාව iv. චේතිය වංසට්ඨ කථාව

03. අනුරාධපුර යුගයේ අභ්‍යන්තර වෙළෙඳපොළක පරිපාලනය පිළිබඳ තොරතුරු ඇතුළත් සෙල්ලිපිය වන්නේ.

i. බදුලු ටැම් ලිපිය ii. තෝනිගල ලිපිය

iii. මිහින්තලා පුවරු ලිපිය iv. වේවැල්කැටිය සෙල්ලිපිය

04. "ඉතිහාසය අමතක කිරීම අත්තිවාරමක් නොමැතිව කරන ඉදිකිරීමක් වැනිය" මෙම ප්‍රකාශය කළේ.

i. ඊ. එච්. කාර්ය. ii. ජී. එම්. ට්‍රෙවිලියන්ය.

iii. ටී. එස්. එලියට්ය. iv. ශ්‍රී ජවහර්ලාල් නේරුය.

05. 'පිතිමහරජ" නමින් සෙල්ලිපි වල සඳහන් වන මුල් අනුරාධපුර පාලකයා කවරෙක්ද?

i. දුටුගැමුණු රජතුමාය. ii. ධාතුසේන රජතුමාය.

iii. මානවම්ම රජතුමාය. iv. වළගම්බා රජතුමාය.

06. පැරණි වංස කථා වල මණිහිරවාපි ලෙස හඳුන්වා ඇති වැව වන්නේ.

i. කලා වැව ii. පරාක්‍රම සමුද්‍රය

iii. මින්නේරිය වැව iv. නාච්චදූව වැව

07. I රාජේන්ද්‍ර චෝළ රජතුමා සිරකරුවෙකු ලෙස චෝළ දේශයට රැගෙන ගිය පාලකයා වූයේ.

i. පස්වන මිහිඳු රජුය. ii. හතරවන මිහිඳු රජුය.

iii. පළමුවන සේන රජුය. iv. පස්වන කාශ්‍යප රජුය.

www.pirivena.lk

08. කුඩා අවදියේදී දකුණු ඉන්දියාවේ පල්ලව රාජ්‍යයේ ඇති දැඩි වී ලංකාවට පැමිණ නව රජ පෙළපතක් බිහි කළ අනුරාධපුර පාලකයා වන්නේ,

i. වසභ රජතුමාය. ii. මහසෙන් රජතුමාය.

iii. පළමුවන මුගලන් රජතුමාය. iv. මානවම්ම රජතුමාය.

09. සිංහල පන්සිය පනස් ජාතක පොත රචනා කරනු ලැබුවේ කුමන යුගයේදී ද?

i. දඹදෙණිය ii. කුරුණෑගල

iii. කෝට්ටේ iv. මහනුවර

10. මුල්ලේරියා සටනේදී පෘතුගීසි ජාතිකයන්ට අන්ත පරාජයක් අත්කර දෙනු ලැබුවේ කවරෙකු විසින්ද?

i. පළමු රාජසිංහ රජු ii. දෙවන රාජසිංහ රජු

iii. මායාදුන්නේ රජු iv. ධර්මපාල රජු

11. සුප්‍රකට අන්කෝර්වට්හි විහාරය පිහිටියේ,

i. බුරුමයේ (මියන්මාරයේ)ය. ii. ලාඕසයේ ය.

iii. ජපානයේය. iv. කාම්බෝජයේය.

12. ත්‍රිපිටකය ලී පුවරු වල ලියා තැන්පත් කොට තිබෙන කොරියානු විහාරය කුමක්ද?

i. මිරුක් විහාරය ii. ආනන්ද විහාරය

iii. හෙන්සා විහාරය iv. බෝරොබුදූර් විහාරය

13. ක්‍රි. ව. හත්වන සියවසේ ඉන්දියාවේ නාලන්දා විශ්ව විද්‍යාලයට වැඩම කොට වසර දහසයක් අධ්‍යාපනය හැදෑරූ චීන භික්ෂූන් වහන්සේ වූයේ,

i. පාහියන් හිමිය. ii. හියුංසාං හිමිය. iii. ඉට්සිං හිමිය. iv. සං යුං හිමිය.

14. බටහිර ඉන්දියාවේ පිහිටි පැරණි ගෝව නගරය පෙරදිග මූලස්ථානය ලෙස භාවිතා කළ යුරෝපා ජාතිකයන් වන්නේ,

i. ලන්දේසීන්ය. ii. ප්‍රංශ ජාතිකයන්ය.

iii. පෘතුගීසි ජාතිකයන්ය. iv. බ්‍රිතාන්‍ය ජාතිකයන්ය.

15. රෝමයේ අධිරාජ්‍යවාදී ආණ්ඩුවක් පිහිටවූ පළමු පාලකයා වූයේ,

i. ක්ලෝඩියස් ii. නීරෝ

iii. ජස්ටිනියන් iv. ඔගස්ටස් සීසර්

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැලපෙන නාමයතෝරන්න.

16. i. ථූපාරාමය ii. ලංකාරාමය iii. තිරියාය iv. අභයගිරිය

17. i. කදම්බ නදී | ii. ගෝණ නදී | iii. මහා වාලුකා නදී | iv. ගම්භීර නදී

18. i. සොරොව්ව | ii. ධාතු ගර්භය | iii. බිසෝකොටුව | iv. පිටවාන

19. i. දොළොස්දහස් රට | ii. අටදහස් රට | iii. පස්යොදුන් රට | iv. දහස්තොට

20. i. ගල් විහාරය | ii. ලංකාතිලක විහාරය | iii. මහා විහාරය | iv. පොත්ගුල් විහාරය

- අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් දී ඇත. ඒවා අතුරින් එක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.

21. i. ජුපිටර් — යුද්ධයට අධිපති දෙවියා | ii. වීනස් — ආලයට අධිපති දෙවඟන
iii. නෙප්චූන් — මුහුදට අධිපති දෙවියා | iv. ජුනෝ — ඉතාමත් වැදගත් දේවතාවිය

22. i. චේතියගිරිය — මිහින්තලය | ii. චිත්තල පබ්බත — සිතුල්පව්ව
iii. සුභ පබ්බත — යාපහුව | iv. අරිට්ඨ පබ්බත — කුරුණෑගල

23. i. අංග — චම්පා | ii. කෝසල — බරණැස
iii. මවත්ස — කොසඹෑ (කෝසම්බි) | iv. සුරසේන — මථුරා

24. i. කාවන්තිස්ස — විහාරමහා දේවි | ii. පළමු විජයබාහු — තිලෝක සුන්දරී
iii. පළමු පරාක්‍රමබාහු — රත්නාවලී | iv. වළගම්බා — සෝමාදේවි

25. i. ඉසුරුමුණිය — අනුරාධපුරය | ii. රන්කොත් විහාරය — පොළොන්නරුව
iii. කොටවෙහෙර — දැදිගම | iv. පබළු වෙහෙර — කතරගම

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් අංක 1 ද,

(B) සහ (C) පමණක් නිවැරදි නම් අංක 2 ද,

(C) සහ (D) පමණක් නිවැරදි නම් අංක 3 ද,

(A) සහ (D) පමණක් නිවැරදි නම් අංක 4 ද,

සලකුණු කරන්න.

26. ග්‍රීකයන්ගේ ආගමික විශ්වාස හා ඇදහිලි සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේද?

i. ස්වභාවික වස්තු වලට දේවත්වය ආරෝපණය කරමින් වැඳුම් පිදුම් කිරීම.

ii. දෙවිවරු සාමාන්‍ය මිනිසුන් මෙන් ක්‍රියා කරන බව විශ්වාස කිරීම.

iii. බොහෝ දෙවිවරු භූතාත්ම ලෙස පිළිගැනීම.

iv. සිබලේ දෙවඟන බලගු දේවතාවිය ලෙස සැලකීම.

27. ධාතුසේන රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේද?

i. ලම්බකර්ණ රාජවංශයට අයත්වීම.

ii. ජේතවන ස්තූපය සාදවා නිම කිරීම.

iii. මන්නාරමේ යෝධ වැව ඉදිකිරීම.

iv. ෂට් ද්‍රවිඩ ආක්‍රමණය පරාජය කිරීම.

28. කෝට්ටේ රාජධානිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේද?

i. කෝට්ටේ බලකොටුව සේනාධිලංකාර විසින් ඉදිකිරීම.

ii. හයවන පරාක්‍රමබාහු රජතුමා ප්‍රථම වරට අගනුවර කරගැනීම.

iii. සපුමල් කුමරු යොදවා යාපනයේ ආර්ය චක්‍රවර්තීවරු පරාජය කිරීම.

iv. සද්ධර්මරත්නාවලී කෘතිය මේ යුගයේ රචනා කිරීම.

29. උඩරට නායක්කර් වංශය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේද?

i. දකුණු ඉන්දියාවේ සිට මෙහි පැමිණි පිරිසකගෙන් පැවත එන රාජවංශයකි.

ii. පිය පුතුඋරුමය මත පරම්පරාවට රජකම හිමිවීම.

iii. සෑම පාලකයෙකුම ඉංග්‍රීසි සමග ගිවිසුම් ඇතිකර ගැනීම.

iv. රාජවංශයේ ප්‍රධාන රජවරු හතර දෙනෙකු පාලනය කිරීම.

30. බ්‍රිතාන්‍ය පාලන සමයේ ලංකාවේ ඇති වූ සමාජ වෙනස්වීම් අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

i. කම්කරු පන්තියක් බිහිවීම.

ii. සමාජය තුළ ධනපති හා කම්කරු ලෙස පන්ති දෙකක් බිහිවීම.

iii. සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තය බිඳ වැටී වතු ආර්ථික ක්‍රමයක් ඇතිවීම.

iv. කතෝලික ආගම මුහුදුබඩ ප්‍රදේශ වල ව්‍යාප්ත වීම.

- අංක31 සිට 35දක්වාඑක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන සමූහයක් x සහ y තීරුවල දී ඇත. x තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවලට නො වේ. y තීරුව, x තීරුව සමග ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| | x | | y |
|---|---|---|---|
| 01. | නැවු රාලිස් හිස්ටෝරියා | - | A ප්‍රොකෝපියස් |
| 02. | භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය | - | B ප්ලිනි |
| 03. | පර්සියානු යුද්ධය | - | C ටොලමි |
| 04. | ටොපෝග්‍රැපියා ක්‍රිස්ටියානා | - | D කොස්මස් |

www.pirivena.lk

i. ABCD ii. BCAD iii. CBDA iv. DABC

32. x y

01. මල්වතු ඔය නිම්නය - A උරුවෙල ග්‍රාමය

02. කලා ඔය නිම්නය - B කල්‍යාණිගාම

03. කිරිඳි ඔය නිම්නය - C අනුරාධගාමය

04. කැළණිගඟ නිම්නය - D මහාගාම

i. ABDC ii. BCAD iii. CADB iv. DCBA

33. x y

01. අසිග්ගාහක - A ප්‍රධාන ලේකම්

02. මහලේනා - B අශ්ව පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා

03. අස අඳෙක - C ඇතුන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා

04. හති අඳෙක - D කඩු දරන්නා

i. ADBC ii. BCDA iii. CDAB iv. DABC

34. x y

01. යාපහුව පර්වතය - A සුබ සෙන්පති

02. ගෝවින්දමලය - B සංඛ සෙනෙවි

03. දඹදෙණිය - C බුවනෙකබාහු ආදිපාද

04. ගංදෙනිය පර්වතය - D තුන්වන විජයබාහු

i. ACDB ii. BADC iii. CABD iv. DCAB

35. x y

01. ක්‍රි. ව. 1865 - A පානදුර වාදය

02. ක්‍රි. ව. 1866 - B ගම්පොළ වාදය

03. ක්‍රි. ව. 1871 - C බද්දේගම වාදය

04. ක්‍රි. ව. 1873 - D උඳන්විට වාදය

i. ABCD ii. BCDA iii. CDBA iv. DCAB

- අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන 1, 2, 3, 4 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 01 | නිවැරදිය | නිවැරදිය |
| 02 | නිවැරදිය | වැරදිය |
| 03 | වැරදිය | වැරදිය |
| 04 | වැරදිය | නිවැරදිය |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36 | වසභ රජතුමා විසින් වැව් 11 ක් හා ඇළ මාර්ග 12 ක් ඉදිකරන ලදී. | දෙවන අග්බෝ රජතුමා විසින් කන්තලේ හා ගිරිතලේ වැව් ඉදිකරන ලදී. |
| 37 | මහා විජයබාහු රජතුමා චෝළ ග්‍රහණයෙන් රජරට ප්‍රදේශය මුදවා ගන්නා ලදී. | මහා විජයබාහු පුත්‍රයා වූ නිශ්ශංකමල්ල රජු කාලිංග මාඝගෙන් රට නිදහස් කර ගන්නා ලදී. |
| 38 | පෘතුගීසි ජාතිකයන් ලංකාවට පැමිණියේ ක්‍රි.ව. 1602 දීය. | ලන්දේසි ජාතිකයන් පළමුවන රාජසිංහ රජු සමග 1638 දී ගිවිසුමක් ඇති කරගන්නා ලදී. |
| 39 | ක්‍රි.පූ. 336 දී බලයට පත් ඇලෙක්සැන්ඩර් දක්ෂ අශ්වාරෝහකයෙකු මෙන්ම රණශූරයෙකු වේ. | ග්‍රීක පෞර රාජ්‍ය වල වාසය කළ වහලුන්ටද පුර වැසිභාවය හිමිවිය. |
| 40 | බින්දුසාර රජතුමා චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ පුත්‍රයා විය. | අමිත්‍රඝාත හෙවත් සතුරු රජවරුන් නසන්නා ලෙස ඔහු හඳුන්වා ඇත. |

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven Year End Term Test - 2019

**05 ශ්‍රේණිය/Grade 05**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I, II
History I, II

ඉතිහාසය II

සැලකිය යුතුයි :

i. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක්ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01.

i ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කර නම් කරන්න.

1. වන නදී  2. මඩකලපුව  3.නල්ලූර්

4. මහියංගනය  5. පොළොන්නරුව  6. කැළණිය

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

- පහත දී ඇති A හා B රූපසටහන් අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. (අ) A වලින් දැක්වෙන රූපය කුමක්ද?

(ආ) මෙය පිහිටි ඓතිහාසික නගරය කුමක්ද?

(ඉ) මෙය කුමන කාර්යයක් සඳහා භාවිතා කරන ලද ගොඩනැගිල්ලක්ද?



(ලකුණු 3)

iii. (අ) B රූපයෙන් දැක්වෙන දෙවියන් කවරෙක්ද?

(ආ) මෙම දෙවියන් කුමකට අධිපති දෙවියෙකු වීද?

(ඉ) මෙම දෙවියන් වන්දනාමාන කළ පැරණි යුරෝපා රට කුමක්ද?



(ලකුණු 3)

02 "ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයනයෙහිලා පුරා විද්‍යා මූලාශ්‍රය ඉතා වැදගත් වේ."

i පුරා විද්‍යා මූලාශ්‍රය වර්ග දෙකක් නම් කරන්න.

(ලකුණු 2)

www.piriyena.lk

ii ඉහත (i) ට අදාළව ඔබ විසින් නම් කරන ලද පුරා විද්‍යා මූලාශ්‍රය වර්ග දෙකකට උදාහරණ දෙක බැගින් සඳහන් කරන්න.

(ලකුණු 4)

iii ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී පුරා විද්‍යා මූලාශ්‍රය වල ඇති ඓතිහාසික වටිනාකම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

03

i පැරණි ශ්‍රී ලංකාවේ පිහිටි ස්වභාවික වරාය දෙකක් නම් කරන්න.

(ලකුණු 2)

ii ශ්‍රී ලංකාවේ පැරණි වරාය ඔස්සේ පැමිණි,

(A) සංක්‍රමණ දෙකක්ද,

(B) ආක්‍රමණ දෙකක්ද සඳහන් කරන්න.

(ලකුණු 4)

iii ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම නිසා මෙරට ආවේණික සංස්කෘතියක් බිහි වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

04 "අනුරාධපුර යුගයේ වාරි පද්ධතිය පැරණි ශ්‍රී ලංකාවේ තාක්ෂණයේ විශිෂ්ඨ ලක්ෂණයකි."

i පහත දැක්වෙන වැව් ඉදිකළ රජවරු නම් කරන්න.

(A) අභය වැව (B) නුවර වැව

(ලකුණු 6)

ii පැරණි ශ්‍රී ලාංකිකයන්ට වැව් ඉදිකිරීමට බලපෑ හේතු 2 ක් සඳහන් කරන්න.

(ලකුණු 4)

iii පැරණි ලාංකිකයන්ට වාරිමාර්ග ඉදිකිරීමේ තාක්ෂණික නිපුණතාවක් තිබූ බව වැවක අංග දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

05 පහත සඳහන් සිද්ධි වලට අදාල පොළොන්නරුවේ පාලකයන් නම් කරන්න.

i 1. ගල් විහාර කතිකාවත පිහිටුවීම.

2. රන්කොත් වෙහෙර ඉදිකිරීම.

(ලකුණු 2)

ii පොළොන්නරුව අගනුවර වශයෙන් තෝරා ගැනීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 2)

iii මහා විජයබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

www.pirivena.lk

06

i පෘතුගීසි ජාතිකයන් උඩරට රාජධානිය අල්ලාගැනීමට උත්සාහ දරණ ලදපහත සඳහන් වර්ෂ වල සිදු වූ සටන් නම් කරන්න.

1. ක්‍රි. ව. 1594

2. ක්‍රි.ව. 1630

(ලකුණු )

ii පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 4)

iii ලන්දේසි ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ වල පවත්වාගෙන යන ලද පාලනය හේතුවෙන් ඇති වූ ප්‍රතිඵල දෙකක් සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 6)

07 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය ඇසුරින් පහත සඳහන් මාතෘකා දෙක පැහැදිලි කරන්න.

i 1848 දෙවන නිදහස් අරගලය

ii සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(ලකුණු 6)

08 පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ ඓතිහාසික තෙරතුරු දක්වන්න.

i ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස

ii මහින්දාගමනය ලංකා සමාජය කෙරෙහි ඇති කළ බලපෑම

iii අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳ වැටීම.

iv ග්‍රීක යුගයේ අධ්‍යාපනය හා දර්ශනවාද

v ක්‍රි. පූ 6 වන සියවසේ සමූහාණ්ඩු පාලන ක්‍රමය

(ලකුණු 6)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2020

# Primary Piriven Year End Test - 2020

## 05 ශ්‍රේණිය/Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I, II
History I, II

කාලය : පැය තුන යි
Time : Three Hours

## ඉතිහාසය I

සැලකිය යුතු යි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමිවේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට අදාළ කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. ඉතිහාසය යනු "හේතුඵල වාදය" යැ යි ප්‍රකාශ කළේ,

1. ඊ.එච්. කාර් ය.
2. ජී. එච්. ට්‍රෙවිලියන් ය.
3. ශ්‍රී ජවහල්ලාල් නේරු ය.
4. වින්ස්ටන්ට් චර්චිල් ය.

02. මහාවංශය රචනා කිරීමේ දී ප්‍රධාන වශයෙන් පරිශීලනය කරන ලද ග්‍රන්ථය වන්නේ කුමක් ද?

1. දීපවංශය
2. උත්තර විහාරට්ඨ කථා
3. සීහලට්ඨ කථා
4. විනයාට්ඨ කථා

03. වල්ලිපුරම් රන් සන්නසට අනුව නාගදීපය පාලනය කළ ඇමතිවරයා කවුද ?

1. ඉසිගිරි
2. බුදල්නා
3. සූකරභාතුදේව
4. කිත්නුවර

04. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් වලින්

1. 65650 කි.
2. 65610 කි.
3. 65660 කි.
4. 65640 කි.

05. ප්‍රාග් ඓතිහාසික තොරතුරෙහි ඇතුළත් පාහියංගල ලෙන පිහිටා ඇති දිස්ත්‍රික්කය වන්නේ,

1. රත්නපුර දිස්ත්‍රික්කය යි.
2. කෑගල්ල දිස්ත්‍රික්කය යි.
3. මාතලේ දිස්ත්‍රික්කය යි.
4. කළුතර දිස්ත්‍රික්කය යි.

06. පණ්ඩුකාභය රජු වෙස්සවණ දෙවියාගේ වාසය සඳහා වෙන් කළ ගස වන්නේ,

1. තල් ගස ය.
2. නුග ගස ය.
3. බෝ ගස ය.
4. ඇසතු ගස ය.

www.pirivena.lk

07. අශෝක රජු අරිට්ඨ කුමරුට ප්‍රදානය කළ තනතුර වන්නේ,

1. සේනාපති ය.
2. පුරෝහිත ය.
3. දණ්ඩනායක ය.
4. සිටු තනතුර ය.

08. අනුරාධපුර නගරය නිර්මාණය කළ වාස්තු විද්‍යාඥයා කවුරුන්ද ?

1. පණ්ඩුල
2. ජෝතිය
3. අභය
4. නාග

09. දුටුගැමුණු රජු හා සද්ධාතිස්ස කුමරු සමගි කරවන ලද භික්ෂුව වූයේ,

1. ගෝඨගත්ත තෙරුන්ය.
2. කාශ්‍යප තෙරුන්ය.
3. කුපික්කල තිස්ස තෙරුන්ය.
4. මහා තිස්ස තෙරුන්ය.

10. පොලොන්නරු යුගයේ තෙවරක් රාජ්‍ය බලයට පත් වූයේ කවුද ?

1. මහ විජයබාහු රජු
2. මහා පරාක්‍රමබාහු රජු
3. කල්‍යාණවතී රැජිණ
4. ලීලාවතී රැජින

11. යාපහුව රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ,

1. පළමුවන බුවනෙකබාහු රජු ය.
2. පළමු විජයබාහු රජු ය.
3. දෙවන බුවනෙකබාහු රජු ය.
4. දෙවන විජයබාහු රජු ය.

12. 1848 දෙවන නිදහස් සටනේ නායකයෙකු වන්නේ,

1. කැප්පෙට්ටිපොල දිසාව ය.
2. ගොන්ගාලේගොඩ බණ්ඩා ය.
3. තුටැවේ රටේ රාළ ය.
4. ඇහැළේපොල නිළමේ ය.

13. ටොරින්ටන් ආණ්ඩුකාරයා පැනවූ බද්දක් නොවන්නේ මින් කුමක් ද?

1. පොල්ගස් බද්ද
2. ඇඟ බද්ද
3. සුනඛ බද්ද
4. කඩසාප්පු බද්ද

14. ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු ලැබෙන ස්ථානයක් නොවන්නේ මින් කුමන ස්ථානයේ ද?

1. අනුරාධපුරය
2. පාහියංගල
3. බටදොඹලෙන
4. පදියගම්පල

15. වර්ෂ 1797 දී මුහුදුබඩ ප්‍රදේශයේ බ්‍රිතාන්‍ය විරෝධි කැරැල්ලේ නායකයා කවුද ?

1. කැප්පෙට්ටිපොල
2. ඇහළේපොල
3. සියද්‍රොසා අප්පු
4. වීරපුරන් අප්පු

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන පිළිතුර තෝරන්න.

16. 1. කපුගම් පිරිවෙණ　　2. දෙමටමල් පිරිවෙණ
3. අළගිරි පිරිවෙණ　　4. ආලාහන පිරිවෙණ

17. 1. මහවැලි ගඟ　　2. කළු ගඟ
3. අඹන් ගඟ　　4. වළවේ ගඟ

18. 1. උදේනි ගාම　　2. ඌරුවෙල ගාම
3. මාගම　　4. විජිත ගාම

19. 1. නන්දිමිත්‍ර　　2. සුරනිමල
3. ලභියවසභ　　4. දීඝජන්තු

20. 1. යාපහුව　　2. පඬුවස්නුවර
3. ගම්පල　　4. කුරුණෑගල

- අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය අඩංගු පිළිතුර තෝරන්න.

21. 1. බද්දෙගම වාදය - 1865
2. වරාගොඩ වාදය - 1864
3. ගම්පල වාදය - 1871
4. පානදුරා වාදය - 1873

22. 1. දඹදෙණිය - කව්සිළුමිණ
2. කුරුණෑගල - සිංහල බෝධිවංශය
3. ගම්පොල - මයුර සන්දේශය
4. කෝට්ටේ - තිසර සන්දේශය

23. 1. කාලිංග මාඝ පාලනය - දෙවන පරාක්‍රමබාහු රජු
2. චෝල පාලනය - පළමු විජයබාහු රජු
3. පීඨිය - මහසෙන් රජු
4. දාඨිය - වළගම්බා රජු


www.pirivena.lk

24. 1. කුමභකාර ගාම - කුඹල් කර්මාන්තය
2. පේසකාර ගාම - උක් කර්මාන්තය
3. වඩ්ඪකී ගාම - වඩු කර්මාන්තය
4. මණිකාර ගාම - මැණික් කර්මාන්තය

25. 1. යාපහුව පර්වතය - සුභසෙන් පති
2. ගන්දෙණිය පර්වත - සංඛ සෙනවියා
3. දඹදෙණිය - බුදල්මි
4. ගෝවින්ද මාලය - බුවනෙක බාහු ආදිපාද

- අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවල දක්වා ඇති'ල ඊල ක හා ෘ යන ප්‍රකාශ අතරින් දෙකක් නිවැරදි ය. එම පිළිතුරුවලින් නිවැරදි ප්‍රකාශ දෙක තෝරා

**A** සහ **B** පමණක් නිවැරදි නම් අංක 1 ද | **B** සහ **C** පමණක් නිවැරදි නම් අංක 2 ද
**C** සහ **D** පමණක් නිවැරදි නම් අංක 3 ද | **A** සහ **D** පමණක් නිවැරදි නම් අංක 4 ද

පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

26. පණ්ඩුකාභය රජ සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි ද ?
A තිසාවැව ඉදි කිරීම.
B දසවන රාජ්‍ය වර්ෂයේ ග්‍රාම සීමා ලකුණු කිරීම.
C අනුරාධපුරය රාජධානිය ලෙස ගොඩ නැගීම.
D මුළු දිවයින ම එක්සේසත් කරන ලදි.

27. කිත්සිරිමෙවන් රජතුමා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේ ද ?
A ඉන්දියාවේ සමුද්‍රගුප්ත රජු සමග සම්බන්ධතා පැවතීම.
B ලාංකීය වන්දනා කරුවන්ට බුද්ධගයාවේ විශ්‍රාම ශාලාවක් ඉදි කිරීම.
C මධුරාපුර කුමාරිකාවක් ගෙන්වා අගබිසව කර ගැනීම.
D රාජරාජ නම් සොළී පාලකයාගේ ආක්‍රමණය එල්ල වීම.

28. යාපනය රාජ්‍ය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද ?
A යාල්පාන වෛපමාලෙ කෘතියේ තොරතුරු සඳහන් වීම.
B වරෝදය රජු ජනතාව අතර ජනප්‍රිය වීම.
C පෘතුගීසි ලංකාවට එනවිට සංකිලි යාපනය පාලනය කිරීම.
D ආර්ය චක්‍රවර්තී රජවරුන් දොළොස් දෙනෙකු පාලනය කළ බව සඳහන් වීම.

29. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි ද ?

A ක්‍රි.ව. 1638 ගිවිසුමෙන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ සියල්ල ලන්දේසීන් අතට පත් විය.

B ලන්දේසීන් විසින් කතෝලික ආගම ප්‍රචාරය කරන ලදි.

C ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශය ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම යටතේ පාලනය විය.

D ලන්දේසි පාලන ප්‍රදේශ කොමාණ්ඩරි තුනකට බෙදා තිබුණි.

30. අශෝක අධිරාජයා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේ ද ?

A අශෝක අධිරාජයාට හිමාලයේ සිට කොමරින් තුඩුව දක්වා සමස්ත ඉන්දියාව ම අයත් විය.

B අශෝක ධර්මය ප්‍රචාරය කිරීමට සෙල්ලිපි භාවිත කරන ලදි.

C මෙතුමා නිග්‍රෝධ සාමණේරයන්ගෙන් බණ අසා බෞද්ධයෙකු බවට පත් විය.

D දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා මෙතුමා අනුග්‍රහය දැක්විය.

- අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. එම ප්‍රකාශන කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. ඒවා ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට නිවැරදි වරණය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

31.

| | X | | Y |
|---|---|---|---|
| 1. | මල්වතු ඔය | A | කාචරගාම |
| 2. | කලා ඔය | B | අනුරාධගාම |
| 3. | කැළණි ගඟ | C | උරුවේලගාම |
| 4. | මැණික් ගඟ | D | කල්‍යාණි ගාම |

1. A, B, C, D  2. B, C, D, A  3. B, D, A, C  4. D, A, C, B

32.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ගම්පල | A | පස්වන පරාක්‍රමබාහු රජු |
| 2. | දැදිගම | B | සිව්වන බුවනෙකබාහු රජු |
| 3. | යාපනය | C | අලකේශ්වර පවුල |
| 4. | රයිගම | D | ආර්ය චක්‍රවර්තී |

1. B, A, D, C  2. A, C, B, D  3. B, A, C, D  4. C, B, A, D

www.pirivena.lk

33.

| | X | | Y |
|---|---|---|---|
| 1. | මහවිලච්චිය වැව | A | ධාතුසේන රජු |
| 2. | කලාවැව | B | මහසෙන් රජු |
| 3. | හුරුළු වැව | C | පණ්ඩුකාභය රජු |
| 4. | ගාමිණී වැව | D | වසභ රජු |

1. B, C, A, D   2. A, B, D, C   3. D, A, B, C   4. D, A, C, B

34.

| | X | | Y |
|---|---|---|---|
| 1. | කෝල්බෲක් ප්‍රතිසංස්කරණය | A | 1910 |
| 2. | මැණිං ප්‍රතිසංස්කරණය | B | 1833 |
| 3. | ඩොනමෝර් ප්‍රතිසංස්කරණය | C | 1920 |
| 4. | කෲ මැකලම් ප්‍රතිසංස්කරණය | D | 1931 |

1. A, B, C, D   2. B, A, C, D   3. C, D, A, B   4. B, C, D, A

35.

| | X | | Y |
|---|---|---|---|
| 1. | බඩගරික | A | සේනාපති |
| 2. | ශෙනපති | B | ප්‍රධාන පුරෝහිත |
| 3. | මහමත | C | භාණ්ඩාගාරික |
| 4. | දොවාරික | D | දොරටුපාලක |

1. C, A, B, D   2. A, B, C, D   3. B, C, A, D   4. D, C, B, A

* අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නවලට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන ප්‍රකාශය දැයි තෝරා ගෙන අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය | නිවැරදි ය |
| 2 | නිවැරදි ය | වැරදි ය |
| 3 | වැරදි ය | වැරදි ය |
| 4 | වැරදි ය | නිවැරදි ය |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36 | වළගම්බා රාජ්‍ය සමයේ දී පළමු වරට නිකාය භේදය ඇති විය. | මාතලේ අලුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළේ ය. |
| 37 | සුරතිස්ස රාජ්‍ය සමයේ සේනගුත්තික අශ්ව වෙළෙඳුන් රාජ්‍ය පැහැර ගත්තේ ය. | සේන ගුත්තිකයන් අවුරුදු විස්සක් රටේ පාලනය ගෙන යාම. |
| 38 | මහා පරාක්‍රමබාහු දැදුරු ඔය හරස් කර අමුණු බැඳ කෘෂිකර්මාන්තයට ජලය ලබා දුන්නේ ය. | දැදුරු ඔය සමීපයේ කොට්ටබද්ද, සූදරනිජ්ජර, දෝරදන්තික යන ස්ථාන හරස් කොට ජලය රිදීබැඳි ඇළ හරහා පහත් බිම්වලට යොදා ගැනීම. |
| 39 | ක්‍රි.ව. 1029 දී V වන මිහිඳු රජු මිය ගියේ ය. | ඔහු පුත් කස්සප කුමරු රුහුණ මුල්කොට චෝල විරෝධී සටනට නායකත්වය දුන්නේ ය. |
| 40 | කිරි, දී කිරි, මෝරු, ගිතෙල්, වෙඬරු එළුවන්ගෙන් ලබා ගෙන ඇත. | අනුරාධපුර යුගයේ ගවමස් ආහාරයට ගැනීම ප්‍රචලිත විය |

www.pirivena.lk

මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2020

**Primary Piriven Year End Test - 2020**

**03 ශ්‍රේණිය/Grade 03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I, II
**History Science I, II**

ඉතිහාසය II

සැලකිය යුතු යි :

i. අංක 01 ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
ii. එක් ප්‍රශ්නයට ලකුණු 60ක් හිමි වේ.

01.

i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

1. අනුරාධපුර 2. පොළොන්නරුව
3. [illegible] 4. දඹුලු ගල
5. කැලණිය 6. ගාල්ල

(ලකුණු 1 × 6 = 6)



A

ii. 1. A රූපයේ දැක්වෙන ප්‍රතිමාව කුමක් ද ?

2. එම ප්‍රතිමාව පිහිටි ස්ථානය කුමන රාජධානියේ ද ?

3. එම ප්‍රතිමා රටාවේ මුද්‍රාව කුමක් වේ ද ?

(ලකුණු 1 × 3 = 3)

iii. 1. B රූපයේ දැක්වෙන්නේ කුමක් ද ?

2. මෙය හමු වූ ස්ථානය කුමක් ද ?

3. මෙම නිර්මාණය නිර්මිත ලෝහය කුමක් ද ?



B

02 "අනුරාධපුර යුගයේ අවසාන භාගයේ ලංකාවේ දේශපාලන ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රධාන මූලාශ්‍ර ශිලාලේඛන වේ."

i ශිලාලේඛනයේ [illegible] (ලකුණු 02)

ii ශිලාලේඛනයේ [illegible] (ලකුණු 04)

iii අනුරාධපුර යුගය අවසානය [illegible] ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැදෑරීමේ දී [illegible] (ලකුණු [illegible])

www.pirivena.lk

03

i. ශ්‍රී ලංකාවට ඇති ලිඛිත ප්‍රධාන මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. පර්වත ලිපි දෙකක් සහ සෙල්ලිපි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්න ව පිහිටීම නිසා ඇති වූ බලපෑම් කිහිපයක් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04

i. පළමු ශ්‍රී ලාංකික භික්ෂුව සහ භික්ෂුණිය නම් කරන්න. (ලකුණු 02)

ii. පූර්ව බෞද්ධ ඇදහිලි හා විශ්වාස හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පැරණි ශ්‍රී ලාංකිකයන් වැව් බැඳි තාක්ෂණයේ උසස් කුසලතාවයක් ලබා සිටි බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05 "අනුරාධපුරය ශ්‍රී ලංකාවේ දීර්ඝතම රාජධානිය යි"

i. අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලනය කළ රජවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

ii. අනුරාධපුර යුගයේ රජකම උරුම වූ ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. වළගම්බා මහ රජතුමාගෙන් සිදු වූ සේවාවන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06 "ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ස්වර්ණමය යුගය පොළොන්නරු යුගය යි"

i. පොළොන්නරු යුගයේ ඉදිකරන ලද වැව් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. මහා පරාක්‍රමබාහු රජුගේ විදේශ ආක්‍රමණ දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

iii. නිශ්ශංකමල්ල රජු මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කර ඒවා ජය ගත් ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

www.pirivena.lk

i. පළමු නිදහස් සටනේ නායකයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. පළමු නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පළමු නිදහස් සටන නොහොත් 1818 සටනට බලපෑ හේතු තුනක් සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 06)

08 පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ව ඓතිහාසික තොරතුරු විස්තර කරන්න.

i. අභිලේඛන

ii. බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය

iii. දෙවැනි පරාක්‍රමබාහු රජුගේ දේශපාලන ක්‍රියාදාමය

iv. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු

v. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය 1931

(එක් කොටසකට ලකුණු 6 බැගින්)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - *பிரிவேனா கல்விக் கிளை*
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**ඉතිහාසය - I, II** **5 ශ්‍රේණිය**

## ඉතිහාසය - I

සැලකිය යුතුයි :
- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- ❖ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ❖ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- ❖ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

01. ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාස පුවත ගෙනහැර දක්වන වංස කතාව කුමක් ද?
1. දීපවංසය ව 2. මහාවංසය 3. බෝධිවංසය 4. ථූපවංසය

02. අනුරාධපුර යුගයේ වගා කළ කන්න තුන ගැන සඳහන්ව ඇති සෙල්ලිපිය කුමක් ද?
1. වේවැල්කැටිය ලිපිය 2. මිහින්තලා පුවරු ලිපිය
3. තෝනිගල සෙල්ලිපිය 4. බදුලු ටැම් ලිපිය

03. ප්‍රාග් ඓතිහාසික යුගයේ තොරතුරු ලැබෙන වෙරළ ආශ්‍රිත එළිමහන් වාසස්ථානයක් වන්නේ මින් කුමක් ද?
1. මිනිහාගල්කන්ද 2. කිතුල්ගල බෙලිලෙන
3. පාහියන් ලෙන 4. පොතාන

04. ප්‍රථමයෙන් ලක්දිව දී භික්ෂුණියක බවට පත් වූ ශ්‍රී ලාංකික කාන්තාව කවුද?
1. අනුලා දේවිය 2. කුසුමා දේවිය
3. සෝමා දේවිය 4. ලීලාවතී දේවිය

05. පොලොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ ආසන්නතම හේතුව කුමක් ද?
1. චන්ද්‍රභානුගේ ආක්‍රමණය 2. හල්ලුකගේ ආක්‍රමණය
3. එළාරගේ ආක්‍රමණය 4. කාලිංග මාඝගේ ආක්‍රමණය

06. කලා ඔය නිම්නයේ පිහිටි පැරණි ජනාවාසය මින් කුමක් ද?
1. උරුවෙල ගාමය 2. අනුරාධ ගාමය 3. උදේනි ගාමය 4. උපතිස්ස ගාමය

07. මහවැලි ගංගා නිම්නයේ පිහිටි රාජධානිය මින් කුමක් ද?
1. අනුරාධපුරය 2. කුරුණෑගල 3. මහනුවර 4. කෝට්ටේ

08. ලම්බකර්ණ රාජ වංසයේ ආරම්භක පාලකයා කවුද?
1. නිශ්ශංකමල්ල රජු 2. කාශ්‍යප රජු 3. මානවම්ම රජු 4. වසභ රජු

09. ශ්‍රී ලංකාවේ පැරණිම ඓතිහාසික ස්තූපය මින් කුමක් ද?
1. රුවන්වැලිසෑය 2. ථූපාරාමය 3. ජේතවනාරාමය 4. මිරිසවැටිය

10. අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ,
1. පණ්ඩුකාභය රජු ය. 2. දුටුගැමුණු රජු ය. 3. විජය රජු ය. 4. දේවානම්පියතිස්ස රජු ය.

11. යාපහුවේ පර්වතය කේන්ද්‍ර කරගෙන ප්‍රථම වරට බලකොටුවක් ඉදිකළේ කවරෙක් ද?
1. සුභ සෙනෙවියා 2. සංඛ සෙනෙවියා
3. බුවනෙකබාහු ආදිපාද 4. පළමුවන බුවනෙකබාහු

12. බෞද්ධ පාසල් පිහිටුවීමේ පුරෝගාමී නායකත්වය ගෙන කටයුතු කළේ කවරෙක් ද?
1. අනගාරික ධර්මපාල තුමා 2. වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා
3. ඕල්කට් තුමා 4. පියදාස සිරිසේන මහතා

13. මාගම රාජධානියේ ආරම්භක පාලකයා කවුද?
1. කාවන්තිස්ස රජු 2. දුටුගැමුණු රජු 3. ගෝඨාභය රජු 4. මහානාග රජු

14. ශ්‍රී මහා බෝධිය රැගෙන සඟමිත් තෙරණිය ඇතුළු පිරිස ලංකාවට වැඩම කළ තොටුපල මින් කුමක් ද?
1. දඹකොළ පටුන 2. ලංකා පටුන 3. ගොඩවාය 4. ගෝකණ්ණතිත්ථ

15. වැවක ජලය සොරොව්වකින් පිටතට මුදා හැරීමේ දී පීඩනය අවම කර ගැනීම සඳහා යොදා ගන්නා වාරි අංගය වන්නේ මින් කුමක් ද?
1. පිටවාන 2. රළපනාව 3. සොරොව්ව 4. බිසෝකොටු

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. 1. උපතිස්ස 2. විජිත 3. අනුරාධ 4. මහානාග

17. 1. මඩුගල්ලේ 2. පිළිමතලාව 3. පුරන්අප්පු 4. කැප්පෙටිපොළ

18. 1. නන්දිමිත්‍ර 2. දීඝජන්තු 3. සුරනිමල 4. භරණ

19. 1. විජය 2. පඩුවස්දෙව් 3. භද්දකච්චායනා 4. සේන ගුත්තික

20. 1. රයිගම 2. දඹදෙණිය 3. යාපහුව 4. ගම්පොල

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නාම/ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම/ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. 1. කරලියද්දේ - දොන් ක්‍රැස්තෝ 2. කුසුමාසන දේවිය - දෝන කතරිනා
3. යමසිංහ බණ්ඩාර - දොන් පිලිප් 4. කොනප්පු බණ්ඩාර - දොන් ජුවාන්

22. 1. බද්දේගම වාදය - 1865 2. පානදුරා වාදය - 1873
3. ගම්පොළ වාදය - 1865 4. උදන්විට වාදය - 1866

23. 1. යාපහුව පර්වතය - සුභ සෙන්පති 2. දඹදෙණිය - වන්නි විජයබාහු
3. ගන්දෙණිය පර්වතය - සංඛ සෙනෙවි 4. ගෝවින්ද මලය - වික්‍රමබාහු ආදිපාද

24. 1. හතරවන මිහිඳු රජු - මිහින්තලා ලිපිය
2. පළමුවන විජයබාහු - පනාකඩුව තඹ සන්නස
3. වසභ රජු - වල්ලිපුරම් රන් සන්නස
4. නිශ්ශංකමල්ල රජු - ගල්විහාර කතිකාවත

25. 1. සංඝමිත්තා තෙරණිය - දඹකොළ පටුන
2. පණ්ඩුවාසදේව - මහාතිත්ථ
3. හේමමාලා හා දන්ත කුමරු - ගොඩවාය
4. භද්දකච්චායනා - ගෝකණ්ණතිත්ථ

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A) , (B) , (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**
  - **(A) සහ (B) පමණක් නිවැරදි නම්, අංක 1 ද,**
  - **(B) සහ (C) පමණක් නිවැරදි නම්, අංක 2 ද,**
  - **(C) සහ (D) පමණක් නිවැරදි නම්, අංක 3 ද,**
  - **(A) සහ (D) පමණක් නිවැරදි නම්, අංක 4 ද, සලකුණු කරන්න.**

26. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ භූගෝලීය පිහිටීමේ ලක්ෂණ අතරින් පහත කවර ලක්ෂණ නිවැරදි වේ ද?
   A. ඉන්දියාවට ආසන්නව පිහිටීම.
   B. දකුණු ඉන්දියාව සමග එකිනෙකට සම්බන්ධව පිහිටීම.
   C. දකුණු ආසියාවේ කුඩාම දූපත ලෙස පිහිටා තිබීම.
   D. ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීම.

27. වළගම්බා රජතුමා මුහුණදුන් අභියෝග අතරින් පහත දැක්වෙන කවර ඒවා නිවැරදි වේ ද?
   A. ෂට් ද්‍රවිඩ ආක්‍රමණට මූහුණ දීම
   B. තීය බමුණාගේ කැරල්ලට මූහුණ දීම
   C. බැමිණිතියා සාගතයට මූහුණ දීම
   D. චන්ද්‍රභානුගේ ආක්‍රමණයට මුහුණ දීම

28. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් හඳුන්වාදුන් යෝජනා වන්නේ,
   A. අගමැතිගේ ප්‍රධානත්වයෙන් යුතු කැබිනට් මණ්ඩලයක් පත්කිරීම.
   B. රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම.
   C. විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම.
   D. සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට විශේෂ විධි විධාන යෙදීම.

29. පොළොන්නරු යුගයේ වාරි කර්මාන්ත සම්බන්ධයෙන් පහත සඳහන් කුමන කරුණු නිවැරදි වේ ද?
   A. මහා විජයබාහු රජතුමා වැව් එකොළහක් ඉදිකිරීම.
   B. නිශ්ශංකමල්ල රජතුමා වැඩිම වැව් තැනවූ පාලකයා වේ.
   C. තෝපා, දුඹුටුලු, එරබදු වැව් එක් කොට පරාක්‍රම සමුද්‍රය තැනවීම.
   D. රජරට වාරි ඉතිහාසයේ දියුණුම අවස්ථාව සනිටුහන් කිරීම.

30. 1848 දෙවන නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු වන්නේ,
   A. සටන මනාව සංවිධානය වී නොතිබීම.
   B. බිම් පාලු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම.
   C. බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය අවස්ථාවල දී අතිරේක සේනාව ලැබීම.
   D. සිංහලයන්ට නවීන අවි ආයුධ සහ පුහුණු හමුදාවක් නොතිබීම.

- **අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන X තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුවේ ඒවා X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. පඩුවස්දෙව් රජු | A. සෝමා දේවිය |
| 2. කාවන්තිස්ස රජු | B. භද්දකච්චායනා |
| 3. වට්ටගාමිණි අභය රජු | C. විහාරමහා දේවිය |
| 4. පළමුවන විජයබාහු රජු | D. තිලෝකසුන්දරී |

1. A B C D   2. B C A D   3. B A D C   4. B C D A

32. X | Y

1. දකපති
2. මතෙරමජිබක
3. මඩිගෙ
4. බොජකපති

A. ඉඩම් බද්ද
B. ජල බද්ද
C. ප්‍රවාහනය සම්බන්ධ බද්ද
D. මසුන් ඇල්ලීමෙන් අය කළ බද්ද

1. A D C B  2. C B A D  3. C A D B  4. D C A B

33. X | Y

1. සූරතිස්ස රජු
2. අසේල රජු
3. පරාක්‍රම පාණ්ඩ්‍ය රජු
4. දෙවන පරාක්‍රමබාහු රජු

A. එළාර
B. සේනගුත්තික
C. කාලිංග මාඝ
D. චන්ද්‍රභානු

1. A B C D  2. D C B A  3. B A C D  4. A D B C

34. X | Y

1. අභය වැව
2. තිසා වැව
3. කලා වැව
4. මින්නේරිය වැව

A. දේවානම්පිය තිස්ස රජු
B. පණ්ඩුකාභය රජු
C. මහසෙන් රජු
D. ධාතුසේන රජු

1. A B D C  2. A B C D  3. D C B A  4. B A D C

35. X | Y

1. අනුරාධපුරය
2. පොලොන්නරුව
3. කෝට්ටේ
4. මහනුවර

A. පණ්ඩුකාභය රජු
B. හයවන පරාක්‍රමබාහු රජු
C. සේනාසම්මත වික්‍රමබාහු රජු
D. පළමුවන පරාක්‍රමබාහු රජු

1. A D B C  2. A B C D  3. D C B A  4. A C D B

- **අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා එහි අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36 | වල්ලිපුරම් රන් සන්නස වසභ රජ දවසට අයත් වේ. | ගල්පොත සෙල්ලිපිය නිශ්ශංකමල්ල රජුට අයත් වේ. |
| 37 | වැවක විශිෂ්ට නිර්මාණයකි බිසෝ කොටුව. | වැව් බැම්මට හානි නොවන ලෙස ජල පීඩනය අවම කර, බිසෝ කොටුව හරහා සොරොව්වට ජලය පිට කරයි. |
| 38 | මහා පරාක්‍රමබාහු රජ දවස පළමුවරට නිකාය භේදය ඇතිවිය. | වළගම්බා රජු නිකාය අතර සමගිය ඇති කළේය. |
| 39 | ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන්නේය. | කෲව් මැකලම් ආණ්ඩුක්‍රමයෙන් ප්‍රථම වරට සීමිත ඡන්ද බලය හඳුන්වා දී ඇත. |
| 40 | මෙරට ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ෆ්‍රෙඩ්රික් නෝර්ත් ය. | ශ්‍රී ලංකාවේ අවසාන රජු ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය. |

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

**ඉතිහාසය - I, II** **5 ශ්‍රේණිය**

## ඉතිහාසය - II

**සැලකිය යුතුයි :**

❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. i. **ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.**

1. අනුරාධපුරය 2. මහනුවර 3. ගාල්ල
4. කැලණි ගඟ 5. නල්ලූර් 6. මහාතිත්ථ

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)

ii. **පහත A හා B රූප සටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(අ) A රූපයෙන් දැක්වෙන ස්තූපය කුමක් ද?

(ආ) මෙය කරවූ රජතුමා කවුරුන් ද?

(ඉ) මෙම ස්තූපය වටා ඇති කණුවලින් පෙන්නුම් කෙරෙන්නේ කුමක් ද?


A

(ලකුණු 1 × 3 = 3)

iii. (අ) B වලින් දක්වා ඇති චිත්‍රය කුමක් ද?

(ආ) මෙය කුමන රජුගේ කාලයට අයත් වේ ද?

(ඉ) මෙම නිර්මාණය කුමන සියවසට අයත් වේ ද?


B

(ලකුණු 1 × 3 = 3)

02. i. මහාවංසයේ මුල් කොටස රචනා කළ කතුවරයා නම් කර මහාවංසයට ලියන ලද ටීකාව සඳහන් කරන්න. (ලකුණු 02)

ii. ඉතිහාසය ඉගෙනීමෙන් මිනිසාට ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. අභිලේඛන යනු කුමක් ද? ඒවායේ වැදගත්කම උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. i. මිහිඳු මහරහතන් වහන්සේ සමඟ වැඩම කළ භික්ෂූන් දෙනමක් නම් කරන්න. (ලකුණු 02)

ii. මිහිඳු මහරහතන් වහන්සේ මෙරට දී දේශනා කළ සූත්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. දේවානම්පියතිස්ස රජ සමයේ දේශපාලනික සහ සංස්කෘතික වැදගත්කම නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. i. පොලොන්නරුව හඳුන්වන වෙනත් නම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. පළමුවන විජයබාහු රජු පිළිබඳ තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රය දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලන කාර්යභාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 06)

05. i. කෝට්ටේ යුගයේ සිටි පඬිවරුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

ii. දෙවන පරාක්‍රමබාහු රජුගේ ආගමික සේවා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. හයවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලන කාර්යභාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. i. මෙරට පාලනය කළ අවසාන ලන්දේසි ආණ්ඩුකාරවරයා හා ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ලකුණු 02)

ii. බ්‍රිතාන්‍යයන් ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. උඩරට පහසුවෙන්ම ඉංග්‍රීසින්ට යටත් කර ගැනීමට බලපෑ හේතු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. පහත සඳහන් මාතෘකා යටතේ ලංකාවේ ජාතික පුනරුදයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

i. බෞද්ධාගමික පුනරුදය (ලකුණු 06)

ii. හින්දු ආගමික පුනරුදය (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

i. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය

ii. 1818 පළමු නිදහස් සටන

iii. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා

iv. ප්‍රාග් මහින්ද යුගයේ ඇදහිලි හා විශ්වාස

(ලකුණු 6 × 2 = 12)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**

அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் – *பிரிவேனா கல்விக் கிளை*

State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**

**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**

Year End Term Test – 2021 (2022)

**ඉතිහාසය - II**

සැලකිය යුතුයි :

- ❖ දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 1 (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා බාර දෙන්න.

0



සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**ඉතිහාසය - I, II** **5 ශ්‍රේණිය**

## ඉතිහාසය - I

සැලකිය යුතුයි :

- ❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ. (1 × 40 = 40)
- ❖ අංක 01 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවල, දී ඇති (1) , (2) , (3) , (4) යන වරණ අතරින් නිවැරදි හෝ වඩාත් යෝග්‍ය වරණය තෝරා ඔබට ලැබී ඇති පිළිතුරු පත්‍රයේ අදාල කවය තුළ (×) ලකුණ යොදන්න.

➢ අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

01. ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය ගෙන හැර දක්වන වංසකතාව කුමක් ද?
(1) බෝධිවංසය (2) මහාවංසය (3) දාඨාවංසය (4) ධාතුවංසය

02. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයනය සඳහා දැනට ඇති පැරණිම සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද?
(1) දීපවංසය (2) ථූපවංසය
(3) වංසත්තප්පකාසිනිය (4) සමන්තපාසාදිකාව

03. දසමහා යෝධයන් පිළිබඳ මහාවංසයේ එන පුවත සනාථ වන සෙල්ලිපිය කුමක් ද?
(1) ගොඩවාය ලිපිය (2) බදුලු ටැම් ලිපිය
(3) කටුගහගල්ගේ ලිපිය (4) සංඛපාල විහාර ලිපිය

04. ශ්‍රී ලංකාවේ බරණී සුසාන හමුවන ස්ථානයක් වන්නේ,
(1) පොම්පරිප්පුව (2) ඉබ්බන්කටුව
(3) පිංවැව (4) ගල්සොහොන්කනත්ත

05. විජයගේ අගනුවර ලෙස සලකනු ලබන්නේ,
(1) උපතිස්සගාම (2) අනුරාධගාම (3) තම්මැන්නාව (4) විජිතගාම

06. අනුරාධපුර අවසන් භාගයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයා කවුරුන් ද?
(1) පස්වන මිහිඳු (2) හතරවන මිහිඳු
(3) මහසෙන් (4) ධාතුසේන

07. හෝපිටිගමුව සෙල්ලිපියේ වෙළඳපළ හඳුන්වා ඇත්තේ?
(1) පදිය (2) පදිලද්දන් (3) පූග (4) කලහුමනක

08. සංඝමිත්තා තෙරණිය ඇතුලු පිරිස ශ්‍රී මහා බෝධිය රැගෙන ලංකාවට වැඩම කල වරාය වන්නේ,
(1) දඹකොළපටුන (2) මහාතිත්ථ (3) ගෝකණ්ණතිත්ථ (4) ලංකාපටුන

09. දඹදෙණි රාජධානියේ ආරම්භක පාලකයා කවුරුන් ද?
(1) දෙවන පරාක්‍රමබාහු (2) දෙවන විජයබාහු
(3) තුන්වන විජයබාහු (4) පළමුවන විජයබාහු

10. පැපිලියාන සුනේත්‍රාදේවි පිරිවෙන ඉදිකරන ලද්දේ කුමන යුගයේ ද?
(1) කුරුණෑගල (2) කෝට්ටේ (3) ගම්පොල (4) මහනුවර

11. ලන්දේසීන්ගේ පෙරදිග ප්‍රධාන පාලන මධ්‍යස්ථානය කුමක් ද?
(1) කැලිකට් (2) ගෝවා (3) කරිකාල් (4) බතාවිය

12. හෙන්සා විහාරය පිහිටා ඇති රට කුමක් ද?
(1) කොරියාව (2) ජපානය (3) කාම්බෝජය (4) තායිලන්තය

13. සොළොස්මහා ජනපද අතර සමූහාණ්ඩුවක් වන්නේ,
(1) මගධය (2) වත්ස්‍ය (3) කෝසල (4) මල්ල

14. රෝම ශිෂ්ඨාචාරය ආරම්භ වූ ගංගාව වන්නේ,
(1) හොවැංහෝ නදිය (2) ටයිබර් නදිය
(3) නයිල් නදිය (4) ටයිග්‍රිස් නදිය

15. ජලෝත් පීඩන මූලධර්මය සොයා ගත්තේ කවුරුන් ද?
(1) ආකිමිඩීස් (2) ඇරිස්ටෝටල්
(3) සොක්‍රටීස් (4) ප්ලේටෝ

❖ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා වරණ හතර බැගින් දී ඇත. ඒවා අතුරින් එක් වරණයක් කවර හෝ හේතුවක් නිසා අනෙක් ඒවා සමඟ නොගැලපේ. එම නොගැලපෙන වරණය තෝරන්න.**

16. (1) මහා විහාරය (2) සීගිරිය (3) අභයගිරිය (4) ජේතවනය
17. (1) අනුරාධගාම (2) විජිතගාම (3) කාවරගාම (4) උපතිස්සගාම
18. (1) මහසෙන් (2) ධාතුසේන (3) වළගම්බා (4) නිශ්ශංකමල්ල
19. (1) වාහල්කඩ (2) ගර්භය (3) හතරැස් කොටුව (4) දේවතා කොටුව
20. (1) රිජ්නිලස් (2) ඇරිස්ටෝපනිස් (3) සුරිපීඩිස් (4) සොපොත්ලින්

❖ **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් දී ඇත. ඒ අතුරින් එක් නාම / ප්‍රකාශන යුගලයක පද ඒකිනෙක නොගැළපේ. එම නොගැලපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. (1) ඇරිස්ටෝටල් - තර්ක ශාස්ත්‍රයේ පියා
(2) පයිතගරස් - ගණිත විද්‍යාවේ පියා
(3) හෙරඩෝටස් - ඉතිහාසයේ පියා
(4) ආකිමිඩිස් - නවීන විද්‍යාවේ පියා

22. (1) මහාතිත්ථ - විජය ඇතුලු පිරිස
(2) ගෝකණ්ණ - භද්දකච්චායනා ඇතුලු පිරිස
(3) පල්ලවංක වරාය - හේමමාලා හා දන්ත කුමරු
(4) දඹකොළපටුන - සංඝමිත්තා තෙරණිය ඇතුලු පිරිස

23. (1) වළගම්බා - අභයගිරිය විහාරය
(2) මහසෙන් - ජේතවන විහාරය
(3) නිශ්ශංකමල්ල - රන්කොත් වෙහෙර
(4) මහාපරාක්‍රමබාහු - ලංකාරාමය වෙහෙර

24. (1) ඩිමුන්ඩෝ - ඇරිස්ටෝටල්
(2) පර්සියානු යුද්ධය - ෆාහියන්
(3) ඉන්ඩිකා - මෙගස්තිනීස්
(4) භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය - ටොලමි

25. (1) ගෘහ භාණ්ඩ - කනප්පු
(2) ඇඳුම් පැලඳුම් - ගාංචු
(3) ආහාර වර්ග - පාන්
(4) ලෙඩරෝග - තෝම්බු

❖ **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා A, B, C, D ලෙස ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරින් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා**

A සහ B පමණක් නිවැරදි නම් අංක 01 ද,
B සහ C පමණක් නිවැරදි නම් අංක 02 ද,
C සහ D පමණක් නිවැරදි නම් අංක 03 ද ,
A සහ D පමණක් නිවැරදි නම් අංක 04 ද, සලකුණු කරන්න.

26. දේවානම්පියතිස්ස රජ සමය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) රුවන්වැලිසෑය ඉදිවීම.
(B) ශ්‍රී මහා බෝධිය රෝපණය වීම.
(C) තිසා වැව ඉදි කිරීම.
(D) දළදා වහන්සේ වැඩම කරවීම.
(1) AB (2) BC (3) CD (4) AD

27. ග්‍රීක යුගයේ සමාජය හා ජන ජීවිතය පිළිබඳ කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ගොවි ජනතාව බහුතරය වීම.
(B) සමාජය කොටස් තුනකින් සමන්විත වීම.
(C) පුරුෂයාට හා කාන්තාවට සමානාත්වයක් හිමි වීම.
(D) පුරවැසියන්ට සැලකිය යුතු විවේකයක් නොතිබීම.
(1) AB (2) BC (3) CD (4) AD


www.pirivena.lk

28. පෘතුගීසීන්ගේ ආගමික කටයුතු සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) කෝට්ටේ රජ පවුල්වල අය කතෝලික ආගමට හරවා ගැනීම.
   (B) කතෝලික ආගම වැළඳ ගත් අය බදුවලින් නිදහස් කිරීම.
   (C) බුදු සමය වර්ධනය වීම.
   (D) දේශීය ආගමිකයන්ට ද සහන සැලසීම.
   (1) AB (2) BC (3) CD (4) AD

29. කෝල්බෲක් ආණ්ඩුකාරගේ යෝජනා සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) ඉංග්‍රීසි අධ්‍යාපනය ආරම්භ කිරීම. (B) ඇමති මණ්ඩලයක් ස්ථාපිත කිරීම.
   (C) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම. (D) පළාත් සංඛ්‍යාව අඩු කිරීම.
   (1) AB (2) BC (3) CD (4) AD

30. ලන්දේසි ආර්ථික කටයුතු සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ?
   (A) කඳුකර ප්‍රදේශයේ තේ වගා කිරීම. (B) රබර් වගාව හඳුන්වා දීම.
   (C) මුතුරාජවෙල අස් වැද්දීම. (D) හැමිල්ටන් ඇළ ඉදි කිරීම.
   (1) AB (2) BC (3) CD (4) AD

❖ **අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙකි. නාම/ ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන X තීරුවේ ඇති නාම/ ප්‍රකාශන සමග කිසියම් ආකාරයට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුවේ ඒවා X තීරුවේ අනුපිළිවෙලට සකස් කල විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| X | | Y |
|---|---|---|
| (1) අනුරාධපුරය | - | A පළමුවන විජයබාහු රජු |
| (2) පොළොන්නරුව | - | B පණ්ඩුකාභය රජු |
| (3) දඹදෙණිය | - | C හයවන පරාක්‍රමබාහු රජු |
| (4) කෝට්ටේ | - | D තුන්වන විජයබාහු රජු |

(1) ADBC (2) BADC (3) DCAB (4) BCAD

32.

| X | | Y |
|---|---|---|
| (1) පණ්ඩුවාස දේව | - | A ගෝකණ්ණ |
| (2) භද්දකච්චායනා | - | B මහාතිත්ථ |
| (3) සංඝමිත්තා තෙරණිය | - | C ලංකාපටුන |
| (4) හේමමාලා හා දන්ත කුමරු | - | D දඹකොළපටුන |

(1) BADC (2) ABDC (3) DCAB (4) DABC

33.

| X | | Y |
|---|---|---|
| (1) මගධ | - | A උදේනිය |
| (2) කෝසල | - | B කොසඹෑ |
| (3) වත්සය | - | C කුසාවතී |
| (4) අවන්ති | - | D රජගහනුවර |

(1) ABDC (2) DCAB (3) DCBA (4) BADC

34. X - Y

(1) දඹදෙණිය - A ගුත්තිල කාව්‍ය
(2) කුරුණෑගල - B මයූර සන්දේශය
(3) ගම්පොල - C දළදා සිරිත
(4) කෝට්ටේ - D කව්සිලුමිණ

(1) ACDB (2) DCBA (3) BACD (4) CBAD

35. X - Y

(1) බද්දේගම වාදය - A 1873
(2) පානදුරා වාදය - B 1866
(3) උදම්විට වාදය - C 1865
(4) ගම්පොළ වාදය - D 1871

(1) CABD (2) BADC (3) DCBA (4) ABDC

❖ **අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළ දී ඇති ප්‍රකාශ යුගලයට ප්‍රදාන හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශ යුගලය දැයි තෝරා එහි අංකය සලකුණු කරන්න.**

| වර්ණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 01 | නිවැරදිය | නිවැරදිය |
| 02 | නිවැරදිය | වැරදිය |
| 03 | වැරදිය | වැරදිය |
| 04 | වැරදිය | නිවැරදිය |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | පනාකඩුව තඹ සන්නස පළමුවන විජයබාහුට අයත් වේ. | එම සන්නසේ විජයබාහු රජුගේ ළමා කාලය පිළිබඳ තොරතුරු ඇතුලත් වේ. |
| 37. | හින්දු ආගමික පුනරුද ව්‍යාපාරයේ නායකයා ආරුමුගනාවලර්තුමා ය. | ඔහු උදයභානු නමින් පුවත්පතක් ආරම්භ කිරීම. |
| 38. | 1815 – 1948 දක්වා මුලු දිවයින ම බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පාලනය විය. | 1815 දී රොබට් බ්‍රවුන්රිග් උඩරට යටත් කර ගැනීම. |
| 39. | අනුරාධපුර යුගයේ රෝහල් ඉදි කළ බවට සාධක හමු නොවේ. | බුද්ධදාස රජතුමා ප්‍රසිද්ධ වෛද්‍යවරයෙකි. |
| 40. | පොළොන්නරුව රාජධානියේ ආරම්භක පාලකයා පරාක්‍රමබාහු රජු ය. | පොළොන්නරුව රාජධානිය චෝළ ආක්‍රමණයෙන් බිඳ වැටීම. |


www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முபுப் பதிப்பஜூரிமையஜுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

**ඉතිහාසය - I , II** **5 ශ්‍රේණිය**

## ඉතිහාසය - II

**සැලකිය යුතුයි :**

❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. i. **ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.**

1. අනුරාධපුර 2. කැළණිය 3. ගෝකණ්ණ
4. දෙවිනුවර 5. නල්ලූර් 6. දීඝවාපි

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)

➢ **පහත සපයා ඇති A හා B රූප සටහන් අධ්‍යයනය කර, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ii. (අ) A වලින් දැක්වෙන අභිලේඛනය කුමක් ද?
(ආ) එය කුමන රජුට අයත් ද?
(ඉ) මෙහි සඳහන් පාලන ප්‍රදේශය කුමක් ද?
(ලකුණු 03)



A

iii. (අ) B වලින් දැක්වෙන රූපය කුමක් ද?
(ආ) එය පිහිටා ඇති රට නම් කරන්න.
(ඉ) මෙය ඉදි කළ රාජවංශය කුමක් ද?
(ලකුණු 03)



B

02. i. ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස පිහිටුවීමෙහිලා වැදගත් වූ ගංගා 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් ව පිහිටි නිසා ඇති වූ බලපෑම 02 ක් නම් කරන්න. (ලකුණු 04)

iii. අනුරාධපුර රාජධානිය බිහිවීම කෙරෙහි භූගෝලීය සාධක බලපෑ අයුරු නිදසුන් 02 ක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

03. i. මිහිඳු හිමි සමඟ වැඩම කළ ධර්මදූතයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

ii. දේවානම්පියතිස්ස රජු මුණගැසුණු මිහිඳු හිමි දේශනා කළ සූත්‍ර 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. මහින්දාගමනය ලාංකීය සමාජය කෙරෙහි ඇති කළ බලපෑම කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. i. අනුරාධපුර යුගයේ මෙරට පාලනය කළ රාජවංශ 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. වැවක තාක්ෂණික අංග 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. අනුරාධපුර යුගයේ පැවති ආර්ථිකය නිදසුන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

05. i. පළමු වන පරාක්‍රමබාහු රජුගේ මව සහ පියා නම් කරන්න. (ලකුණු 02)

ii. නිශ්ශංකමල්ල රජු මුහුණ දුන් අභයෝග 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පළමුවන විජයබාහු රජුගේ දේශපාලන හා ආගමික වැදගත්කම පිලිබඳව නිදසුන් එක බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. i. පෘතුග්‍රීසීන් ලංකාවට පැමිණෙන විට මෙරට පැවති රාජධානි 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. ලන්දේසීන් ලංකාවට පැමිණීමට පසුබිම් වූ හේතු 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ලංකාවේ ආගමික පුනරුදයට බලපෑ හේතු නිදසුන් 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. පහත සඳහන් මාතෘකා යටතේ රෝම ශිෂ්ටාචාරයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

i. සමූහාණ්ඩු පාලනය

ii. ආර්ථිකය

(ලකුණු 6 × 2 = 12)

08. පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

i. හයවන පරාක්‍රමබාහු රජු

ii. අශෝක රජුගේ ධර්මවිජය ප්‍රතිපත්ති

iii. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය

iv. 1818 පළමු නිදහස් සටන

(ලකුණු 6 × 2 = 12)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All rights reserved

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I, II |
|---|---|---|

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 5 ශ්‍රේණිය

## (07) ඉතිහාසය - I, II

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

### ඉතිහාසය I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

- **අංක 01 සිට 15 දක්වා එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. ශ්‍රී ලංකාවේ තොරතුරු ඇතුළත් ''එදා හෙළදිව'' නම් ග්‍රන්ථය රචනා කළේ කවුද?
    1. ක්වේරෝස් 2. ජෝන් ඩොයිලි 3. රොබට් නොක්ස් 4. රිබෙයිරෝ

02. අනුරාධපුර යුගයේ කෘෂිකාර්මික කටයුතුවල දී වගා කළ කන්න (කාල) තුනක් ගැන තොරතුරු ඇතුළත් වන සෙල්ලිපිය තෝරන්න.
    1. බදුලු ටැම් ලිපිය 2. මිහින්තලා පුවරු ලිපිය
    3. වේවැල්කැටිය ලිපිය 4. තෝනිගල ලිපිය

03. ලම්බකර්ණ රාජවංශයේ ආරම්භක පාලකයා කවුද?
    1. දේවානම්පියතිස්ස 2. වසභ 3. ධාතුසේන 4. මහසෙන්

04. පොලොන්නරු රාජධානිය පාලනය කළ රැජිනිය අයත් වන පිළිතුර කුමක් ද?
    1. අනුලා 2. සීවලී 3. තිලෝක සුන්දරී 4. කල්‍යාණවතී

05. යාපහුව අගනුවර වශයෙන් තෝරා ගෙන පළමු වරට රාජධානියක් පිහිටවූ රජතුමා කවරෙක් ද?
    1. තුන්වන විජයබාහු 2. පළමුවන බුවනෙකබාහු
    3. තුන්වන පරාක්‍රමබාහු 4. දෙවන බුවනෙකබාහු

06. කෝට්ටේ බලකොටුවක් ලෙස පළමුව තෝරා ගත්තේ කවුරුන් විසින් ද?
    1. සුභ සෙනෙවියා 2. සංඛ සෙනෙවියා
    3. සේනාධිලංකාර ප්‍රභුවරයා 4. නිශ්ශංක අලකේශ්වර ප්‍රභුවරයා

07. 1818 නිදහස් සටනේ නායකත්වය හිමි වූයේ කවරෙකුට ද?
    1. දොරේසාමි 2. වීර පුරන් අප්පු 3. හඟුරන්කෙත ඩිංගිරාළ 4. වීර කැප්පෙටිපොළ

08. ත්‍රිපිටකය ලී පුවරුවල ලියා තැන්පත් කර ඇති හෙන්සා විහාරය පිහිටි රට කුමක් ද?
    1. ජපානය 2. තායිලන්තය 3. කොරියාව 4. බුරුමය

09. මහානාම රජු දවස ලංකාවට වැඩම කොට අභයගිරි විහාරයේ නැවතී සිට ථේරවාදී බුදුදහම උගත් චීන ජාතික භික්ෂූන් වහන්සේ කවුද?
    1. ඉට්සිං 2. පාහියන් 3. හියුංසාන් 4. බෝධිධර්ම

10. ශ්‍රේෂ්ඨ ග්‍රීක මහා කාව්‍ය දෙකක් වූ ''**ඉලියඩ් සහ ඔඩිසි**'' රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
    1. හෝමර් 2. සැෆෝ 3. වර්ජිල් 4. පිණ්ඩාර්

11. යාල්පාන වෛපමාලෙ කෘතිය අනුව යාපනය රාජධානිය පාලනය කළ පළමු ආර්ය චක්‍රවර්තී පාලකයා කවුරුන් ද?
    1. වික්කිරම  2. පළමු වරෝද  3. කුණවීර  4. විජය කුලංකෙ

12. මහා අස්ථාන නමින් හැඳින් වූ උඩරට පාලකයා වූයේ,
    1. පළමු විමලධර්මසූරිය  2. දෙවන රාජසිංහ
    3. දෙවන විමලධර්මසූරිය  4. කරලියද්දේ බණ්ඩාර

13. පෙරදිග පෘතුගීසි යටත් විජිතවල මූලස්ථානය වූයේ,
    1. බතාවිය  2. මදුරාසිය  3. ගෝව  4. චන්ද්‍රනගර්

14. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය සඳහා ලන්දේසීන් විසින් පිහිටුවා තිබූ කොමාන්ඩරි සංඛ්‍යාව,
    1. 05 කි.  2. 02 කි.  3. 06 කි.  4. 03 කි.

15. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ පළමු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවරෙක් ද?
    1. තෝමස් මෙට්ලන්ඩ්  2. ෆෙඩ්රික් නෝර්ත්
    3. රොබට් බ්‍රවුන්රිග්  4. එඩ්වර්ඩ් බාන්ස්

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. 1. මහවැලි ගඟ  2. කැලණි ගඟ  3. වලවේ ගඟ  4. සින්දු ගඟ

17. 1. වලානේ සිද්ධාර්ථ හිමි  2. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
    3. හික්කඩුවේ සුමංගල හිමි  4. රත්මලානේ ධම්මාලෝක හිමි

18. 1. පාහියන්ගල  2. බටදොඹලෙන  3. බෙලිලෙන  4. ඉබ්බන්කටුව

19. 1. මහානාගහුල  2. උදන්දොර  3. දැදිගම  4. මාගම

20. 1. මෞර්ය චන්ද්‍රගුප්ත රජු  2. දෙවන චන්ද්‍රගුප්ත රජු
    3. බින්දුසාර රජු  4. අශෝක රජු

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. 1. දෝවාරික - දොරටුපාල  2. බඩගරික - භාණ්ඩාගාරික
    3. ඡත්තගාහක - කඩු දරන්නා  4. මහමත - ප්‍රධාන පුරෝහිත

22. 1. සද්ධාතිස්ස - වළගම්බා  2. මායාදුන්නේ - දෙවන රාජසිංහ
    3. හත්වන බුවනෙකබාහු - ධර්මපාල  4. ධාතුසේන - මුගලන්

23. 1. සීහලවත්ථුපකරණය - අනුරාධපුරය  2. පූජාවලිය - දඹදෙණිය
    3. මයුර සන්දේශය - කෝට්ටේ  4. ජාතක කතා පොත - කුරුණෑගල

24. 1. කාම්බෝජය - ලිදයිය රජු
    2. ඉන්දුනීසියාව - විජයෝත්තුංග රජු
    3. ජපානය - සුයිකෝ අධිරාජිනිය
    4. කොරියාව - පෙක්චේ රජු

25. 1. 1833 - කෝල්බෲක් ආණ්ඩුක්‍රමය  2. 1840 - මැනිං ආණ්ඩුක්‍රමය
    3. 1931 - ඩොනමෝර් ආණ්ඩුක්‍රමය  4. 1947 - සෝල්බරි ආණ්ඩුක්‍රමය

www.pirivena.lk

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

    (A) සහ (B) පමණක් නිවැරදි නම් අංක 1 ද,
    (B) සහ (C) පමණක් නිවැරදි නම් අංක 2 ද,
    (C) සහ (D) පමණක් නිවැරදි නම් අංක 3 ද,
    (A) සහ (D) පමණක් නිවැරදි නම් අංක 4 ද, සලකුණු කරන්න.

26. අතීත රජවරුන් විසින් ආගමික හා සුභසාධන කටයුතු සඳහා බෞද්ධ න්‍යාය ධර්ම උපයෝගී කර ගත් බව තහවුරු වන්නේ කවර ප්‍රකාශවලින් ද?
    A. වෙහෙර විහාර ඉදිකිරීම.
    B. වාරි කටයුතු සුරක්ෂිත කිරීම.
    C. අධික ලෙස විවිධ බදු අය කිරීම.
    D. මග දෙපස ඇති විශාල ගස් කපා දැමීම. (.........)

27. ධාතුසේන රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි ද?
    A. වෙහෙර විහාර දහඅටක් ඉදිකිරීම.
    B. මින්නේරිය වැව ඉදි කිරීම.
    C. තුන් නිකාය සමගි කරවීම.
    D. ෂට් ද්‍රවිඩ ආක්‍රමණයට මුහුණ දීම. (.........)

28. අනුරාධපුර රාජධානිය බිඳ වැටීම සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
    A. ජාවක චන්ද්‍රබානුගේ ආක්‍රමණ
    B. කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය
    C. අවසාන භාගයේ දුර්වල පාලකයන් බලයට පත් වීම
    D. පළමු රාජ රාජ හා පළමු රාජේන්ද්‍ර රජුගේ ආක්‍රමණ (.........)

29. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
    A. කතෝලික ආගම හඳුන්වාදීම.
    B. රෝම ලන්දේසි නීති ක්‍රමය හඳුන්වාදීම.
    C. මුද්‍රණ යන්ත්‍රය හඳුන්වාදීම.
    D. 1602 පළමු විමලධර්මසූරිය රජු බලන සටනින් ලන්දේසි පරාජය කිරීම. (.........)

30. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් හඳුන්වා දුන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
    A. රාජකාරී ක්‍රමය අහෝසි කිරීම.
    B. ඒකීය අධිකරණ පද්ධතියක් පිහිටුවීම.
    C. සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම.
    D. විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම. (.........)

- **අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම / ප්‍රකාශන සමග කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුව, Y තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. පළමු සේන රජතුමා | A. සීතාවක |
| 2. පළමු පරාක්‍රමබාහු රජතුමා | B. පොලොන්නරුව |
| 3. පළමු රාජසිංහ රජතුමා | C. මහනුවර |
| 4. සේනාසම්මත වික්‍රමබාහු රජතුමා | D. අනුරාධපුරය |

1. A B D C   2. B C A D   3. C A D B   4. D B A C

32.

| X | Y |
|---|---|
| 1. ප්ලීනි | A. බැද්දේගම |
| 2. පාහියන් | B. නැචුරාලිස් හිස්ටෝරියා |
| 3. ප්‍රකෝපියස් | C. දේශාටන වාර්තා |
| 4. ලෙනාඩ් වුල්ෆ් | D. පර්සියානු යුද්ධය |

1. A B D C   2. B C D A   3. C A D B   4. D B A C

www.pirivena.lk

33. X — Y

1. කුරුවේ බද්ද — A. ප්‍රවාහනවලින් බදු අය කිරීම
2. මඩිගෙ බද්ද — B. කුරුඳු දෙපාර්තමේන්තුව
3. බඩහැල බද්ද — C. අලි ඇතුන් ඇල්ලීම
4. මහ බද්ද — D. කුඹල් කර්මාන්ත

1. A B D C 2. B C A D 3. C A D B 4. D B A C

34. X — Y

1. මගධ — A. පාඨලීපුත්‍ර
2. සූරසේන — B. කොසඹෑ (කෝසම්බි)
3. වත්ස — C. උදේනි
4. අවන්ති — D. මධුරාපුර

1. A D B C 2. B C A D 3. C A D B 4. D B A C

35. X — Y

1. ෆෙඩ්රික් නෝර්ත් — A. සීමිත ඡන්ද ක්‍රමය හඳුන්වාදීම.
2. තෝමස් මෙට්ලන්ඩ් — B. උඩරට ගිවිසුම අත්සන් කිරීම.
3. රොබට් බ්‍රවුන්රිග් — C. ජූරි සභා ක්‍රමය හඳුන්වාදීම.
4. හෙන්රි මැකලම් — D. ශ්‍රේෂ්ඨාධිකරණ පිහිටුවීම.

1. A B D C 2. B C A D 3. C A D B 4. D C B A

- **අංක 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | දේවානම්පියතිස්ස රජු දවස එළාරගේ ආක්‍රමණය එල්ල විය. | මහසෙන් රජතුමාගේ ගුරුවරයා වූයේ සංඝමිත්ත නම් භික්ෂුවකි. |
| 37. | නිශ්ශංකමල්ල රජතුමා කාලිංග වැසියෙකි. | නිශ්ශංකලතා මණ්ඩපය පොලොන්නරුවේ පිහිටා ඇත. |
| 38. | ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ ලංකාවේ අවසාන රජු විය. | කන්නසාමි නමින් උඩරට බලයට පත් වූයේ ශ්‍රී විජය රාජසිංහ රජු ය. |
| 39. | පාතිනන් දේවස්ථානය ග්‍රීක ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ට නිර්මාණයකි. | සොක්‍රටීස් සත්‍ය ගවේෂණයේ යෙදුණු ග්‍රීක දර්ශනවාදියෙකි. |
| 40. | පංච මහා වාද අතර ගම්පොළ වාදය සිදු වූයේ ක්‍රි.ව.1873 දී ය. | හින්දු ආගමික පුනරුද ව්‍යාපාරයේ පුරෝගාමියා ලෙස අරුමුගනාවලර් තුමා හැඳින්විය හැකිය. |

* * *

www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි |
முழுப் பதிப்புரிமையுடையது |
All rights reserved |

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I, II |
|---|---|---|

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)
## 5 ශ්‍රේණිය
## (07) ඉතිහාසය - I, II

**සැලකිය යුතුයි :**

*** පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | | |
|---|---|---|
| 1. පොලොන්නරුව | 2. ඌරාතොට | 3. මහියංගනය |
| 4. දැදුරු ඔය | 5. මාතලේ අලු විහාරය | 6. කාචරගාම |

**(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 × 6 = 06)**

ii. පහත සපයා ඇති A හා B රූප සටහන් අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) A වලින් දැක්වෙන රූපය කුමක් ද?

(ආ) එය හා සම්බන්ධ රජතුමා කවරෙක් ද?

(ඉ) එය හමු වූ දිස්ත්‍රික්කය කුමක් ද?



A රූපය

(ලකුණු 1 × 3 = 03)

iii. (අ) B වලින් දැක්වෙන චිත්‍රයේ නිරූපිත පුද්ගලයාගේ නම දක්වන්න.

(ආ) මෙතුමා සම්බන්ධ වී සිටි ව්‍යාපාරය කුමක් ද?

(ඉ) බුදු දහමේ උන්නතිය ඇති කිරීමට මෙතුමා විසින් ගොඩ නැගූ සමාගම කුමක් ද?



B රූපය

(ලකුණු 1 × 3 = 03)

02. i. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා උපයෝගී කර ගත හැකි වංසකථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. වංසකථාවල ඇති ඓතිහාසික තොරතුරු පුරාවිද්‍යා මූලාශ්‍රවලින් සනාථ වන අවස්ථා දෙකකට නිදසුන් දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. ඉතිහාසය ඉගෙනීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන තුනක් සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. i. ශ්‍රී ලංකාවේ ජනාවාස පිහිට වූ මුල් ආර්යයන් තෝරාගත් වියළි කලාපීය ගංගා නිම්න දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ඉන්දියානු සංක්‍රමණික ජන කණ්ඩායම් තම ජනාවාස පිහිටුවා ගැනීමේ දී වියළි කලාපය තෝරා ගැනීමට තුඩු දුන් හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. දේවානම්පියතිස්ස රාජ්‍ය සමය මෙරට ඉතිහාසයේ වැදගත්වීමට බලපෑ හේතු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. i. අනුරාධපුර යුගයේ රජවරුන් භාවිත කළ විරුද නාම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. පැරණි සෙල්ලිපිවල පහත දැක්වෙන රාජ්‍ය නිලධාරීන් හඳුන්වා ඇති ආකාරය අනුපිළිවෙළින් සඳහන් කරන්න.

(A) **සේනාපති** (B) **ගණකාධිකාරී** (C) **නගරාධිපති** (D) **ප්‍රධාන ලේකම්**

(ලකුණු 04)

iii. අතීතයේ මෙරට රටවැසියා රජුගෙන් අපේක්ෂා කළ යුතුකම් තුනක් ලියා, සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06)

05. i. පොලොන්නරු රාජධානිය පාලනය කළ ශ්‍රේෂ්ඨ රජවරුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. පොලොන්නරුව අගනුවර වශයෙන් තෝරා ගැනීමේ දී අවධානය යොමු කර තිබූ සාධක දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. පොලොන්නරු රාජධානියේ පරිහානියට හා බිඳ වැටීමට තුඩු දුන් හේතු තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

06. i. පහත (a) හා (b) යටතේ දක්වා ඇති නිරිත දිග පාලන මධ්‍යස්ථානවල ආරම්භක පාලකයන් නම් කරන්න.

(a) **දඹදෙණිය** (b) **කුරුණෑගල** (ලකුණු 02)

ii. රාජධානිය නිරිතදිගට විතැන්වීමේ දී පාලකයන්ගේ අවධානය යොමු කොට තිබූ සාධක දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. දෙවන පරාක්‍රමබාහු රජු සමයේ දේශපාලනික හා සංස්කෘතික වැදගත්කම කරුණු තුනක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. i. පළමු හා දෙවන නිදහස් සටන් ආරම්භ වූ අවධියේ ලංකාව පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

ii. පළමු නිදහස් සටනට තුඩු දුන් හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. දෙවන නිදහස් සටනේ ප්‍රතිඵල තුනක් සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක්** පිළිබඳ ඓතිහාසික තොරතුරු දක්වන්න.

i. ප්‍රාග් මහින්ද යුගයේ විශ්වාස හා ඇදහිලි

ii. අනුරාධපුර යුගයේ වාරි තාක්ෂණය

iii. පොලොන්නරු යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය

iv. කෝට්ටේ යුගයේ සාහිත්‍යය

v. ධාතුසේන රජතුමා

(ලකුණු 6 × 2 = 12)

* * *

www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I, II |
|---|---|---|

## මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)
## 5 ශ්‍රේණිය
## (07) ඉතිහාසය - I, II

**සැලකිය යුතුයි :**

* දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01 (I) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.



www.pirivena.lk